# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය

## අනුරාධපුර

# වාර්ෂික වාර්තාව හා ගිණුම්

# 2011

# අපගේ දැක්ම

ආසියාවේ

ථේරවාද බෞද්ධ

උසස් අධ්‍යාපන

ආයතන අතර

ප්‍රමුඛත්වයට

පත්වීම.

# මෙහෙවර ප්‍රකාශය

බෞද්ධ දර්ශනය,
පෙර අපර දෙදිග භාෂා අධ්‍යයනය
ඇසුරින්
තුලනාත්මකව ලබා ගත්,
ධර්ම ශාස්ත්‍රීය
හා
ප්‍රායෝගික ඥානයෙන් හෙබි
ථේරවාද සම්ප්‍රදායානුගත ප්‍රබුද්ධ
විද්‍යාර්ථීන් පිරිසක්
බිහි කිරීම.

# හැඳින්වීම

මහින්දාගමනයත් සමග ලක්දිව බෞද්ධ අධ්‍යාපනය, මහා විහාරය මූලික කර ගෙන අනුරාධපුර රාජධානිය කේන්ද්‍ර කර ගනිමින් ව්‍යාප්ත විය. කාලාන්තරයක් මුළුල්ලේ රාජ්‍ය අනුග්‍රහය ලබමින් විකාශය වූ බෞද්ධ අධ්‍යාපනය පුනර්ජීවනයට ලක්කිරීම හා ථෙරවාදී බුදු දහම පිළිබඳ අධ්‍යයනය, පර්යේෂණ පැවැත්වීම හා ව්‍යාප්ත කරලීම අරමුණු කර ගනිමින් නේවාසික උසස් අධ්‍යාපන ආයතනයක අවශ්‍යතාව සලකා 1968 දී බුද්ධශ්‍රාවක ධර්ම පීඨය පිහිටුවන ලදි.

1968 අංක 16 දරන පනතින් ප්‍රතිෂ්ඨාපිත බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි පරමාර්ථ පුළුල් කරමින්, 1996 අංක 26 දරන පනතින් සංස්ථාපිත බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය දැනට මූලික පරමාර්ථ 06 ක් පෙරදැරි කරගෙන බෞද්ධ අධ්‍යයනාංශය, භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය සහ ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනාංශය යන අධ්‍යයනාංශ 04 කින් යුතුව ජාතික විශ්වවිද්‍යාලයක් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ.

## මහෝපාධ්‍යායයන් වහන්සේගේ පණිවිඩය

මහින්ද චින්තන වැඩ පිළිවෙල යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැඩි දියුණු කොට සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය අංග සම්පූර්ණ ජාත්‍යන්තර බෞද්ධ උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් කිරීමේ පළමු පියවර ලෙස අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් මෙම විශ්වවිද්‍යාලයේ නව පරිශ්‍රයේ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල විවෘත කිරීම 2011 පෙබරවාරි මස 28 දින සිදුවිය. මෙය විශ්වවිද්‍යාලයේ මුළු ගොඩනැගිලි සංකීර්ණයම විවෘත කිරීමක් ලෙස සංකේතවත් කෙරිණ. එමෙන්ම ඉන් අනතුරුව විශ්වවිද්‍යාලයේ සියලුම පරිපාලන නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය මෙම ගොඩනැගිල්ලේ ස්වකීය රාජකාරි කටයුතු ආරම්භ කරන ලදී. මේ අතර රු. මිලියන 268 ක් වෙන් කොට ඇති බෞද්ධ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ද ඉලක්ක කරගත් ආකාරයෙන් කිසියම් ප්‍රගතියක් දක්නට ලැබුණු වර්ෂයක් ලෙස මේ වර්ෂය හැඳින්විය හැකිය. මේ අතර 2010/2011 අධ්‍යයන වර්ෂයට අදාළ නවක ශිෂ්‍යයන්ගේත් අධ්‍යයන කටයුතු ආරම්භ කෙරුණු මෙම වර්ෂයේ දී නවක ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 75 නමකට පමණ මෙම නව පරිශ්‍රයේ අංග සම්පූර්ණ නේවාසිකාගාරයක් ඉදිකර එය ද විවෘත කෙරුණු අතර සියලුම නවක ශිෂ්‍යයන්ට එහි අධ්‍යයන කටයුතු සඳහා නේවාසික වීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී.

විශ්වවිද්‍යාලයට අදාළ වන අනෙකුත් භෞතික සම්පත් වල සංවර්ධනයක් ලෙස ශිෂ්‍යයන් 55 කට තරම් ගමන් කළ හැකි ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා යොදා ගත හැකි බස් රථයක් මිල දී ගැනීමත්, අබලි තත්ත්වයට පත් වෙමින් පැවති වාහන තක්සේරු කොට ඒවා ගර්හිත වාහන ලෙස හඳුනා ගැනීමටත්, වෙන්දේසි කිරීමටත් කටයුතු සැලසුම් කළ අතර විශ්වවිද්‍යාලයේ පරිහරණය සඳහා අවශ්‍ය මොටර් රථ 2ක්, ආසන 16 වෑන් රථයක්, කැබ් රථයක්, මහා භාණ්ඩාගාරය මඟින් ලීසිං පදනම යටතේ මිල දී ගැනීමේ කටයුතු සම්පූර්ණ වීම නිසා විශ්වවිද්‍යාලයට අවශ්‍ය කරන ආකාරයේ මෝටර් වාහන සම්පූර්ණ කර ගැනීමට ද හැකි විය.

මේ අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ඉංග්‍රීසි හා පරිගණක තාක්ෂණ මූලික පාඨමාලා අනිවාර්ය කොට ආරම්භ කිරීමත්, ඒ සඳහා මානව හා භෞතික සම්පත් යම් පමණකට සපුරා ගැනීමට හැකි වීමත්, මෙම වර්ෂය තුළ මා දුටු තවත් ප්‍රගතියකි.

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සංවර්ධන කටයුතුවල ප්‍රගතිය අරමුණු කරගෙන මෙතෙක් විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලා සඳහා අනෙකුත් ජාතික විශ්වවිද්‍යාල අනුගමනය කරන සමාසික හා ඒකක පාඨමාලා ක්‍රමය මෙම විශ්වවිද්‍යාලයට ද හඳුන්වා දීම අරමුණු කරගෙන වෙනත් විශ්වවිද්‍යාලයන්හි ඒ පිළිබඳ ප්‍රවීන විද්වතුන් ගෙන්වා එම පාඨමාලා සැලසුම් කිරීමටත්, 2012 අධ්‍යයන වර්ෂයේ සිට නවක ශිෂ්‍ය භික්ෂූන් සඳහා එම ක්‍රමය හඳුන්වා දීමටත් අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී. ඒ අනුව 2012 අධ්‍යයන වර්ෂයේ සිට මෙම ක්‍රමය යටතේ සියලුම නවක ශිෂ්‍යයන් සඳහා මෙම පාඨමාලා ක්‍රමය

ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. තව ද විශ්වවිද්‍යාලයේ පරමාර්ථ හා අරමුණු වලට අදාළ වන පරිදි පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ ඒ පිළිබඳ ප්‍රවීන මහාචාර්යවරුන් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ගේ ද සංයුතියෙන් කමිටු පත්කොට එම පාඨමාලා ආරම්භ කිරීමට ද මූලික සැලසුම් සිදු කෙරිණ. 2012 අධ්‍යයන වර්ෂයේ සිට එම පාඨමාලා ද ආරම්භ කිරීමට අපේක්ෂිතය.

යොජිත බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට එය සම්මත කර ගැනීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද මේ වර්ෂයේ දී ලබා ගන්නා ලදී. තව ද 2012 අධ්‍යයන වර්ෂය තුළ ම බෞද්ධ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම්වල ඉතිරි වැඩ අවසාන කිරීමටත්, භාෂා අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල සහ නේවාසිකාගාර උපපාලක නිවාසය ඇතුළත්ව ශිෂ්‍ය භික්ෂූන් 96 දෙනෙකුට පමණ ප්‍රමාණවත් වන පරිදි ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමට ද අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කොට ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ මූලික කටයුතු සිදු කරන ලදී.

මේ වර්ෂයේ දී සිදු වූ තවත් කරුණක් වන්නේ වර්ෂය ආරම්භයේ දී බඳවාගත් නවක ශිෂ්‍ය භික්ෂූන් සඳහා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් විසින් නවක වධ පැමිණවීමෙන් අසංවර තත්ත්වයක් වාර්තා වීම හේතුවෙන් විශ්වවිද්‍යාලය තාවකාලිකව වසා දමා විශ්වවිද්‍යාලය තුළ එවැනි කටයුතු ඉදිරියට සිදු වීම නවත්වා ගැනීම අරමුණින් චූදිත ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් 42 ක් පංති තහනමකට ලක්කොට ඔවුන්ට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියා මාර්ග ගැනීමටත්, ඉන් පසුව විශ්වවිද්‍යාලයේ සියලුම අධ්‍යයන කටයුතු යථා පරිදි සිදු කිරීමටත් පියවර ගැනීමයි. සත්‍ය තත්ත්වය බලන විට මේ සිදුවීම තුළින් මේ දක්වා විශ්වවිද්‍යාලය තුළ පැවති අසංවර තත්ත්වයන් සම්පූර්ණයෙන්ම විශ්වවිද්‍යාලය තුළින් ඉවත් කොට විශ්වවිද්‍යාලය තුළ විනය ගරුක ප්‍රිය මනාප භික්ෂු ජීවිතයක් ගත කරන ශිෂ්‍යයන් පිරිසක් ජනිත කර ගැනීමේ මූලික අපේක්ෂාව යම් පමණකට සතුටුදායක ලෙස සම්පූර්ණ කර ගැනීමට හැකි වීම තුළින් එය කාගේත් සතුටට හේතු වන්නක් විය. විශ්වවිද්‍යාලයේ අරමුණු හා පරමාර්ථ සාධනය සඳහා අදාළ විශේෂ පරිවර්තනයක් සිදු වූ වකවානුවක් ලෙස 2011 වර්ෂය හඳුන්වා දීම කාලෝචිත යැයි මම අවසාන වශයෙන් සතුටෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්ථවිර,
මහෝපාධ්‍යායයන් වහන්සේ.

## විශ්වවිද්‍යාලයේ පරමාර්ථ

**1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය පනතේ තුන් (03) වන වගන්තියට අනුව මෙම විශ්වවිද්‍යාලයයේ පරමාර්ථ පහත සඳහන් පරිදිය.**

I. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම.
II. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර බෞද්ධ භාවනාව පිළිබඳව පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
III. ථෙරවාද බුද්ධධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම.
IV. බුද්ධධර්මය හැදෑරීමට සහ ඒ පිළිබඳව පර්යේෂණ කිරීමට ධෛර්යය දීම.
V. බෞද්ධ සංස්කෘතික හා එහි අගයයන් ප්‍රවර්ධනය කිරීම.
VI. ඉහත සඳහන් පරමාර්ථවලට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් කවර වුව ද දෙයක් කිරීම.

අපගේ අරමුණු

- ශිෂ්‍ය භික්ෂූන් වැඩි පිරිසකට උසස් අධ්‍යාපනය ලබා ගැනීමේ පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
- මූලාශ්‍රය අධ්‍යයනය මඟින් ථෙරවාද බුද්ධධර්මය පිළිබඳ විචක්ෂණ දැනුමක් ලබා ගැනීමට මඟ පෙන්වීම.
- ථෙරවාදීය නො වන ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායයන්ගේ මූලික ඉගැන්වීම් පිළිබඳ සාමාන්‍ය දැනුමක් ලබා ගැනීමට මඟ පෙන්වීම.
- බෞද්ධ භාවනාව පිළිබඳ පර්යේෂණාත්මක දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම සහ ගුරු උපදේශ ලබාදීම.
- බුදුදහම සහ බෞද්ධ සංස්කෘතිය පිළිබඳ විචක්ෂණ වීමට අවශ්‍ය දේශන සහ වැඩමුළු සඳහා සම්පත් පුද්ගල සහාය ලබාදීම.
- වඩාත් ඵලදායී භාෂා පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම.
- භික්ෂු ජීවිතයේ අගය පිළිබඳවත් භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳවත් වටහා ගැනීමට අවශ්‍ය සාකච්ඡා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම.
- ධර්ම සන්නිවේදනය, ශාසනික වතාවත් ඉටු කිරීම, ආගමික කටයුතු මෙහෙයවීම ආදිය පිළිබඳ සම්ප්‍රදායානුකූලවත් විචාරාත්මකවුත් දැනුමක් ලබා ගැනීමටත්, ඒවා පිළිබඳ ශ්‍රද්ධා ජනනීය ආකල්පයක් ඇති කර ගැනීමටත් පසුබිම සකස් කිරීම.
- ධර්ම ශාස්ත්‍රීය සේවයට, ආගමික සහජීවනයට සහ සමාජ සේවයට අවශ්‍ය ගුණාංග ප්‍රවර්ධනය කර ගැනීමට සහාය වීම.
- අන්‍යාගමික ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳ තුලනාත්මක දැනුමක් ලබා ගැනීමට පහසුකම් සැලසීම.
- පර්යේෂණ සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය ශික්ෂණය ලබා ගැනීමට සහාය වීම.
- බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයක් සහ භාවනා පරිශ්‍රයක් ඇති කිරීමට පියවර ගැනීම.
- බෞද්ධ අධ්‍යාපනයට අවශ්‍ය පරිගණක දැනුම ඇතුළු තාක්ෂණික ඥානය ප්‍රවර්ධනය සඳහා පවත්නා පහසුකම් වැඩිදියුණු කිරීම.
- බාහිර පාඨමාලා මඟින් විශ්වවිද්‍යාලයයේ ධර්ම ශාසත්‍රීය සේවය පෘථුල කිරීම.
- පාඨමාලාවන්ට අදාළව දේශීය සහ විදේශීය ශිෂ්‍යත්ව පිහිටුවීමට ක්‍රියා කිරීම.

විශ්වවිද්‍යාලයේ නිලධාරීන්

- මහෝපාධ්‍යායයන් වහන්සේ
  පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්ථවිර
  අධ්‍යාපනවේදී (දෙවන පෙළ ඉහළ) අධ්‍යාපන දර්ශනපති, දර්ශනසූරි

- ලේඛකාධිකාරී
  ආර්.එම්.බී. මුතුබණ්ඩා මහතා
  සංවර්ධන අධ්‍යනවේදී (විශේෂ) උපාධිය - (දෙවන පෙළ පහළ)
  පිරිස් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව(ජා.ව්‍ය.ක.ආ)

- මූල්‍යාධිකාරී
  ජයසේන පයාගල මහතා
  පැවරුම් පදනම මත මූල්‍යාධිකාරී

- පුස්තකාලයාධිකාරී
  වයි.කේ. තිස්ස බණ්ඩාර මහතා, වැඩ ආවරණ කිරීම
  ශාස්ත්‍රවේදී (ගෞරව), සමාජීය විද්‍යාපති උපාධිය

- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (විභාග/ ආයතන හා පාලන)
  කේ. රත්නායක මහතා
  ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය, පිරිස් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
  (ජා.ව්‍ය.ක.ආ),ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව

- සහකාර මූල්‍යාධිකාරී
  ජී.ඩබ්. රත්නායක මහතා
  විද්‍යාවේදී (කළමනාකරණ), උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමාව

- සහකාර ලේඛකාධිකාරී
  එස්.එච්.පී.ඊ.එස්. ඒකනායක මහතා
  වාණිජවේදී(විශේෂ), මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

- සහකාර ලේඛකාධිකාරී
  එම්. නිශාන්ත තල්ගහගොඩ මහතා
  විද්‍යාවේදී උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පරිගණක විද්‍යාව), ඉංග්‍රීසි ඩිප්ලෝමාව

- සහකාර අභ්‍යන්තර විගණක
  එන්.ජී. ජයන්ත මහතා
  ව්‍යාපාර කළමනාකරණවේදී (ගණකාධිකරණ) (විශේෂ) උපාධිය වරලත් ගණකාධිකාරී
  අවසාන I විභාගය සමත්

විශ්වවිද්‍යාලයේ බල මණ්ඩල

විශ්වවිද්‍යාල පනතේ III වන කොටසේ II වගන්තිය අනුව විශ්වවිද්‍යාලය පහත සඳහන් බලමණ්ඩලවලින් සමන්විත වේ.

## I උත්තරීතර සභාව

උත්තරීතර සභාවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

(I) ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක අතිපූජ්‍ය දවුල්දෙණ ඥාණිස්සර ස්වාමින් වහන්සේ - මහා මහෝපාධ්‍යායයන් වහන්සේ - 2011-05-31 දක්වා

(II) ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක මාහිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහනසේ නමක්
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක අතිපූජ්‍ය වේවැල්දෙණියේ මේධාලංකාර මාහිමිපාණන් වහන්සේ - මහා මහෝපාධ්‍යායයන් වහන්සේ -2011-06-01 සිට

(III) ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහනසේ නමක්
ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශවයේ මහානායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් වහන්සේ

(IV) ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ මහා නායක මාහිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහන්සේ නමක්
ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ මහා නායක අතිපූජ්‍ය උඩුගම ධම්මදස්සි රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මාහිමිපාණන් වහන්සේ

(V) අනුරාධපුර අටමස්ථානාධිපති නායක හිමිපාණන් වහන්සේ හෝ උන්වහන්සේ විසින් නම් කරන ලද ස්වාමින් වහන්සේ නමක්
අටමස්ථානාධිපති පූජ්‍ය ආචාර්ය පල්ලේගම සිරිසුමන ධම්මරක්ඛිත සිරිනිවාස නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ

(VI) මහෝපාධ්‍යායයන් වහන්සේ
පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නායක ස්වාමින්ද්‍රයාණන් වහන්සේ

(VII) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන උගත් සම්භාවනීය භික්ෂූන් වහන්සේලා පස් නමකට නො වැඩි වූ ස්වාමින් වහන්සේලා සංඛ්‍යාවක් සහ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට සම්බන්ධ ගිහිභවතුන් දෙදෙනෙකු
පූජ්‍ය ත්‍රීකුණාමලේ ආනන්ද අනුනායක ස්වාමින් වහන්සේ
පූජ්‍ය ගිරාඹේ ආනන්ද අනුනායක ස්වාමින් වහන්සේ
පූජ්‍ය මාඳුළුවාවේ සෝභිත ස්වාමින් වහන්සේ
පූජ්‍ය ආචාර්ය ගොඩගම මංගල ස්වාමින් වහන්සේ
පූජ්‍ය මැදගම ධම්මානන්ද ස්වාමින් වහන්සේ
අධිනීතිඥ ආචාර්ය චන්ද්‍රා ජයසේකර මහතා
මහාචාර්ය ජේ.එම්. ගුණදාස මහතා

බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුව වර්ෂ 03 ක කාලයකට විෂයභාර අමාත්‍යවරයා විසින් උත්තරීතර සභාවේ සමාජිකයෝ පත් කෙරෙති.

උත්තරීතර සභාව 2011 වර්ෂයේ දී රැස්වීම් වාර 02 ක් පවත්වා ඇත.

## II පාලක සභාව

බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතෙහි 14 වන වගන්තියෙන් ප්‍රකාශිත පරිදි පහත සඳහන් ආකාරයට පාලක සභාව විශ්වවිද්‍යාලයේ විධායක මණ්ඩලය ද පාලක බල මණ්ඩලය ද වන්නේය.

පාලක සභාවේ සංයුතිය පහත පරිදි ය.

i. මහෝපාධ්‍යායයන් වහන්සේ (නිල බලයෙන්)
පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්වාමීන් වහන්සේ - සභාපති

ii. බුද්ධශාසන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තෙක්
පී.එම්. පටබැඳිගේ මහතා - සාමාජික
එච්.පී. කැෂියන් හේරත් මහතා - 2011-03-04 දින සිට

iii. උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තෙක්
පී.ජී. ජයසිංහ මහතා - අතිරේක ලේකම්- 2010.10.15 දින සිට

iv. විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානීන්
පූජ්‍ය අක්මීමන ධම්මපාල ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ආචාර්ය කඩවත්ගම පියරතන ස්වාමීන් වහන්සේ - 2011.08.15 සිට - සාමාජික
(බෞද්ධ අධ්‍යයන අංශය)
පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ආචාර්ය කනංගමුවේ රාහුල ස්වාමීන් වහන්සේ - 2011.07.27 සිට - සාමාජික
(භාෂා අධ්‍යයන අංශය)
පූජ්‍ය කණුමුල්දෙණියේ චන්ද්‍රසෝම ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ආචාර්ය කල්ලංචියේ රතනසිරි ස්වාමීන් වහන්සේ - 2011.03.22 සිට - සාමාජික
(ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය)
පූජ්‍ය වරදිවෙල විජයසුමන ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම ස්වාමීන් වහන්සේ - 2011.12.01 - සාමාජික
(සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය)

v. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන, බුද්ධ ශාසනයට විශිෂ්ට සේවයක් ඉටුකර ඇති උගත් භික්ෂූන් වහන්සේලා පස් නමකට සහ ගිහි බෞද්ධයන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්
පූජ්‍ය මහාචාර්ය වරාගොඩ පේමරතන ස්වාමීන් වහන්සේ - සාමාජික
පූජ්‍ය මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමීන් වහන්සේ - සාමාජික
පූජ්‍ය අග්ගමහා පණ්ඩිත කොටුගොඩ ධම්මාවාස අනුනායක ස්වාමීන් වහන්සේ
- සාමාජික
පූජ්‍ය නියන්ගොඩ විජිතසිරි අනුනායක ස්වාමීන් වහන්සේ - සාමාජික
පූජ්‍ය ආචාර්ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේ - සාමාජික
මහාචාර්ය පී. විල්සන් මහතා - සාමාජික
අධිනීතිඥ එම්.එස්.බී. රුළපනාව මහතා - සාමාජික
එච්.එම්.කේ. හේරත් මහතා, දිස්ත්‍රික් ලේකම්, අනුරාධපුර - සාමාජික
ආර්.එම්.බී. මුතුබණ්ඩා මහතා (ලේඛකාධිකාරි) - ලේකම්

පාලක සභාව 2011 වර්ෂයේදී පැවැත්වූ වාර ගණන 12 කි.

## III සනාතන සභාව

විශ්වවිද්‍යාල පනතේ 16 (i) වගන්තිය ප්‍රකාරව සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බල මණ්ඩලය වන්නේය. විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා විධානය සනාතන සභාව සතු වන්නේය.

සනාතන සභාවේ සංයුතිය පහත පරිදිය.

i. මහෝපාධ්‍යායයන් වහන්සේ
පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්ථවිර - සභාපති

ii. විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානියා
පූජ්‍ය අක්මීමන ධම්මපාල ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ආචාර්ය කඩවත්ගම පියරතන ස්වාමීන් වහන්සේ - 2011.08.15 සිට - සාමාජික
(බෞද්ධ අධ්‍යයන අංශය)
පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ආචාර්ය කනංගමුවේ රාහුල ස්වාමීන් වහන්සේ - 2011.07.27 සිට - සාමාජික
(භාෂා අධ්‍යයන අංශය)
පූජ්‍ය කණුමුල්දෙණියේ චන්ද්‍රසෝම ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ආචාර්ය කල්ලංචියේ රතනසිරි ස්වාමීන් වහන්සේ - 2011.03.22 සිට - සාමාජික
(ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය)
පූජ්‍ය වරදිවෙල විජයසුමන ස්වාමීන් වහන්සේ
පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම ස්වාමීන් වහන්සේ - 2011.12.01 - සාමාජික
(සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය)

iii. බුද්ධාගම, අධ්‍යාපනය හෝ ඊට සම්බන්ධ කිසියම් විෂයයක් ඉගැන්වීමේ කාර්යයෙහි යෙදී සිටින වෙනත් යම් විශ්වවිද්‍යාලයක අචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් මෙම විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරනු ලබන නියෝජිතයන් තිදෙනක්

* පූජ්‍ය ආචාර්ය මුවඇටගම ඤාණානන්ද ස්වාමීන් වහන්සේ - සාමාජික
* පූජ්‍ය මහාචාර්ය නාඹිරිත්තන්කඩවර ඥානරතන ස්වාමීන් වහන්සේ - සාමාජික
* මහාචාර්ය ආරිය ලගමුව මහතා - සාමාජික

iv. ඉහත ඡේදයෙහි සඳහන් තැනැත්තන් නොවන, විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කාර්යයෙහි යෙදී සිටින ස්ථිර ආචාර්ය මණ්ඩලය විසින් ඔවුන් අතුරින් පත්කර ගනු ලබන ආචාර්යවරු දෙදෙනෙක්

* පූජ්‍ය හෝමාගම ධම්මානන්ද ස්වාමීන් වහන්සේ - සාමාජික
පූජ්‍ය නිවිතිගල සුමිත්ත ස්වාමීන් වහන්සේ (2011.11.14 දින දක්වා) - සාමාජික
* පූජ්‍ය ආචාර්ය කනත්තේගොඩ සද්ධාරතන ස්වාමීන් වහන්සේ - සමාජික (2011.11.14 දින සිට)

v. කිසිදු විශ්වවිද්‍යාලයක ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන ගිහි හෝ පැවිදි පක්ෂයේ උගත් සම්භාවනීය තැනැත්තන් අතුරින් විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්

* පූජ්‍ය ශාස්ත්‍රවේදි නැදගමුවේ විජයමෛත්‍රී ස්වාමීන් වහන්සේ - සාමාජික
* පූජ්‍ය ඊතලවැටුණුවැවේ ඤාණතිලක ස්වාමීන් වහන්සේ - සාමාජික
* පූජ්‍ය රැකව ශ්‍රී ජිනරතන නායක ස්වාමීන් වහන්සේ - සාමාජික
* ආර්.එම්.බී. මුතුබණ්ඩා මහතා (ලේඛකාධිකාරි) - ලේකම්

සනාතන සභාව 2011 වර්ෂයේදී පැවැත්වූ වාර ගණන 11 කි.

## IV. මුදල් කමිටුව

මෙම විශ්වවිද්‍යාල පනතේ 15 වන වගන්තියේ (XVI) වගන්තිය අනුව මුදල් කටයුතු අධීක්ෂණය සඳහා පාලක සභාව විසින් පහත සඳහන් කමිටුව පත් කර ඇත.

| | |
|---|---|
| පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්වාමීන් වහන්සේ | - සභාපති |
| පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන ස්වාමීන් වහන්සේ | - සාමාජික |
| නීතිඥ එම්.එස්.බී.රළපනාව මහතා | - සාමාජික |
| ජී.ඒ. කිත්සිරි මහත, ප්‍රාදේශීය ලේකම්, ම.නු.ප | - සාමාජික |
| ආර්.එම්.බී. මුතුබණ්ඩා මහතා (ලේඛකාධිකාරි) | - සාමාජික |
| ජයසේන පයාගල මහතා (මූල්‍යාධිකාරි) | - සාමාජික |
| ජී.ඩබ්. රත්නායක මහතා (සහකාර මූල්‍යාධිකාරි) | - කමිටු ලේකම් |

2011 වර්ෂයේ දි මුදල් කමිටුව පැවැත්වූ වාර ගණන 06 කි.

## V. ආධුනික අධ්‍යයන නිවාඩු කමිටුව

මෙම විශ්වවිද්‍යාල පනතේ 17 වන වගන්තියේ (vii) (ඇ) අනුව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පහත සඳහන් අයගෙන් සමන්විත ආධුනික අධ්‍යයන නිවාඩු කමිටුවක් පත් කරනු ලැබ ඇත.

| | |
|---|---|
| පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්වාමීන් වහන්සේ | - සභාපති |
| පූජ්‍ය ආචාර්ය මුවඇටගම ඥාණානන්ද ස්වාමීන් වහන්සේ (සනාතන සභික) | - සාමාජික |
| එච්.එම්.කේ. හේරත් මහතා, දිස්ත්‍රික් ලේකම් (පාලක සභික) | - සාමාජික |
| ජ්‍යෙෂ්ඨ.ස. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | |
| ජේ.ඒ. කිත්සිරි මහතා, ප්‍රාදේශීය ලේකම් ම.නු.ප | - සාමාජික |
| ආර්.එම්.බී. මුතුබණ්ඩා මහතා (ලේඛකාධිකාරි) | - සාමාජික |

අධ්‍යයන නිවාඩු කමිටුවේ කාර්යභාරය වන්නේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විශ්වවිද්‍යාලයේ ස්ථිර කථිකාචාර්යවරුන් හා සේවක මහතුන් නිවාඩු ඉල්ලීම් කළ විට එම නිවාඩු විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සංවර්ධනය සඳහා අදාළ වන්නේදැයි තීරණය කොට පර්යේෂණ, ප්‍රකාශන ප්‍රවර්ධනය සඳහා අදාළ විය හැකි නිවාඩු ක්ෂේත්‍ර හඳුනාගෙන පාලක සභාවට නිර්දේශ කිරීම යි.

2011 වර්ෂයේ දී අධ්‍යයන නිවාඩු කමිටුව පැවැත් වූ වාර ගණන 04 කි.

## VII. විගණන හා කළමණාකරණ කමිටුව

| | |
|---|---|
| නීතිඥ එම්.එස්.බී. රළපනාව මහතා (පාලක සභා සාමාජික) | - සභාපති |
| එච්.එම්.කේ. හේරත් මහතා, (දිස්ත්‍රික් ලේකම්තුමා, අනුරාධපුර) | - සාමාජික |
| ඩබ්.ඒ.ආරියරත්න මහතා, අභ්‍යන්තර විගණක හා විමර්ශන අධ්‍යක්ෂ | - සාමාජික |
| ආර්.එම්.බී. මුතුබණ්ඩා මහතා (ලේඛකාධිකාරි) | - සාමාජික |
| කේ.එස්. දයාරත්න මහතා, රජයේ විගණන අධිකාරි (විගණකාධිපති වෙනුවට) | - සාමාජික |
| එන්.ජී. ජයන්ත මහතා, සහකාර අභ්‍යන්තර විගණක | - සාමාජික |
| ජයසේන පයාගල මහතා, පැවරුම් පදනම මත මූල්‍යාධිකාරි | - ආරාධිත |
| ජී.ඩබ්. රත්නායක මහතා, සහකාර මූල්‍යාධිකාරි | - ආරාධිත |

විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්වූ වාර ගණන 03 කි.

## VIII. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

| | |
|---|---|
| පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්වාමින් වහන්සේ | - සභාපති |
| අයි.එම්. සේනාරත්න මහතා, | - සාමාජික |
| (ප්‍රධාන ගණකාධිකාරි) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | |
| ආර්.එම්.බී. මුතුබණ්ඩා මහතා (ලේඛකාධිකාරි) | - සාමාජික |

2011 වර්ෂයේ දී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව පැවැත් වූ වාර ගණන 12 කි.

## 3 a ප්‍රගතිය

මානව සම්පත් සංවර්ධනය යටතේ 2011 වසර තුළ සැලකිය යුතු වර්ධනයක් හා ප්‍රගතියක් විශ්වවිද්‍යාලය විසින් අත්කරගෙන ඇත. විශේෂයෙන් විශ්වවිද්‍යාලයයේ ආචාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii ශ්‍රේණියේ සේවය කල ස්වාමින් වහන්සේලා 02 නමක කුසලතා පදනම මත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය i ශ්‍රේණියට උසස්වීම් ලබා දෙන ලදී. එක් ස්වාමින් වහන්සේ 01 නමක් කථිකාචාර්ය තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර් ii ශ්‍රේණියට උසස් කරන ලදී. එසේම අයදුම්පත් කැඳවා ආධුනික කථිකාචාර්ය තනතුරුවලට ස්වාමින් වහන්සේලා 03 නමක් බඳවා ගන්නා ලදි.

ආචාර්ය මණ්ඩලයේ ගුණාත්මක සංවර්ධනය යටතේ දර්ශනසූරි උපාධිය හැදෑරීම සඳහා චින රජයේ ශිෂ්‍යත්ව මත චීනයට වැඩම කළ කථිකාචාර්ය ස්වාමින් වහන්සේලා 03 නමක් දර්ශනශූරි උපාධිය සම්පූර්ණ කර ඇත. අනතුරුව 2011 වර්ෂයේදී විශ්වවිද්‍යාලයයේ ආචාර්ය මණ්ඩලයට එක් වී ඇත.

විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන විධායක නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් විශේෂ නේවාසික පුහුණු වැඩමුළුවක් පැවැත්වීම 2011 වසර තුළ දී සිදු කරන ලදී.

මිලියන 103 ක වියදමින් ඉදි කළ නව පරිපාලන ගොඩනැගිල්ල 2011 වසර ආරම්භයේ දි විවෘත කොට පරිපාලන කටයුතු එම ගොඩනැගිල්ල තුළ පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදි. මිලියන 268 ක වියදමින් ඉදිකිරීම් ආරම්භ කර ඇති බෞද්ධ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල 2012 සැප්තැම්බර් මාසයේ දි වැඩ අවසන් කිරීමට නියමිතය. එසේම රුපියල් මිලියන 11 ක වියදමින්, ජල සැපයුම් පද්ධතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. එය 2012 ජුලි මස 31 වන දින භාර දී ඇත.

මෙම විශ්වවිද්‍යාලය මඟින් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) සහ ශාස්ත්‍රවේදී (විශේෂ) යන උපාධි පාඨමාලා දෙක පවත්වාගෙන යනු ලැබේ. 2010 වර්ෂයේදී ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පරීක්ෂණයට ශිෂ්‍ය ස්වාමින් වහන්සේලා 108 නමක් පෙනී සිටි අතර, ඉන් 79 නමක් උපාධි ලබා පිටව ගොස් ඇති අතර, 2011 වර්ෂයේදී ශිෂ්‍ය අර්බුද හේතුවෙන් අධ්‍යයන වර්ෂය දීර්ඝ කිරීමට සිදු විය.

උතුරු මැද පළාතේ වෙසෙන සිසු දරුවන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කරලීම පිණිස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය නමින් බාහිර සහතිකපත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීම ද මෙම වසර තුළ සිදු කරන ලදී.

2010/2011 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ පරිගණක දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රථම වර්ෂයේ ශිෂ්‍ය භික්ෂූන් සඳහා අනිවාර්ය විෂය පත්‍රයක් ලෙස තොරතුරු තාක්ෂණ පදනම් පාඨමාලා 1 ක් ආරම්භ කරන ලදි.

## 3 b ළඟා කර ගැනීමට නොහැකි වූ අරමුණු

සෑම වර්ෂයක ම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 100 නමක් බඳවා ගැනීමට බලාපොරොත්තු විය. 2011 වසරේ බඳවා ගැනීමට හැකි වූයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 73 කි. ඉහල ප්‍රථිඵල සහිත ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, සාරිපුත්ත විද්‍යාපීඨය හා අනෙකුත් විශ්වවිද්‍යාලයන් හි අධ්‍යයන කටයුතු හැදෑරීමට වැඩි කැමත්තක් දැක්වීමත්, අනුරාධපුරය වැනි දුෂ්කර ප්‍රදේශයකට පැමිණ අධ්‍යයන කටයුතු කිරීමට ඇති අකමැත්තද මෙයට විශේෂ හේතුවක් ලෙස පෙන්වා දිය හැකිය.

2011 අධ්‍යයන වර්ෂය ආරම්භයේ ශිෂ්‍ය අර්බුද ඇතිවීම නිසා විශ්වවිද්‍යාලය වසා දැමීමට සිදු වු අතර විනය විරෝධි ලෙස හැසුරුණු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා හඳුනා ගැනීමෙන් අනතුරුව උන්වහන්සේලාට විනය පරීක්ෂණ පවත්වා ශිෂ්‍ය භාවය අහෝසි කිරීම, ශිෂ්‍ය භාවය අත්හිටුවීම, තාවකාලික පංති තහනම් කිරීම වැනි තීරණවලට එළඹීමට සිදු විය. මේ නිසා 2010/2011 අධ්‍යයන වර්ෂය 2011 වර්ෂය තුළ අවසන් කිරීමට ද නොහැකි විය.

## 3 c අනාගත සැලසුම්

විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර ප්‍රකාශය සහ පරමාර්ථවලට අනුකූලව ආයතනයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය දර්ශනය 2012- 2016 කාලය සඳහා සකස් කර ඇති සංයුක්ත සැලැස්ම මගින් ඉදිරිපත් කර ඇත.

මෙම සංයුක්ත සැලැස්ම තුළ අධ්‍යයන, ශිෂ්‍ය සුභ සාධනය මෙන්ම කාර්ය මණ්ඩල සුභ සාධනය වර්ධනය කරලීම සඳහා අවශ්‍ය වන්නා වූ උපාය මාර්ගය පැහැදිලිව දක්වා ඇත. එසේම අධ්‍යයන සහ පර්යේෂණ කටයුතුවල ගුණාත්මක බව වර්ධනය කරලීම සඳහා වැඩි අවධානයක් යොමු කොට ඇත.

අධ්‍යයන කටයුතු සංවර්ධනය යටතේ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන ප්‍රථම වසර ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා සඳහා 2011 වර්ෂයේදී තොරතුරු තාක්ෂණය පිළිබඳ පදනම් පාඨමාලාවක් ආරම්භ කර ඇත.

එමෙන් ම දෙවන වසරේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලාට තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවේ දෙවන කොටස 2012 වසරේදී ආරම්භ කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

මීට අමතරව වසරකට අවම වශයෙන් දෙමළ භාෂාව, ජපන් භාෂාව, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය, ජන සන්නිවේදනය යන සහතිකපත්‍ර පාඨමාලා මගින් සහතිකපත්‍ර ලාභීන් 100 දෙනෙකු බිහි කිරීමට සැලසුම් කර තිබේ.

එසේම රජය මගින් ක්‍රියාත්මක කරන ත්‍රිභාෂා ජාතික වැඩ සටහන යටතේ දෙමළ භාෂාව උපාධි විෂයයක් ලෙස 2011/2012  අධ්‍යයන වර්ෂයේ දී ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

විශ්වවිද්‍යාලයයේ ආචාර්යවරුන්ගේ තෝරාගත් ශාස්ත්‍රීය පර්යේෂණ අන්තර්ජාලය මගින් ප්‍රකාශයට පත් කිරීමත්, විශ්වවිද්‍යාලයයේ සිසුන්ගේ තෝරාගත් ශාස්ත්‍රීය නිබන්ධන අන්තර්ජාලය මඟින් එළිදැක්වීමත්, පුරාවිද්‍යාව හා ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන විෂයයන් යටතේ විෂයානුබද්ධ ගවේෂණයන් කිරීමත් 2012 වර්ෂය තුළදී සැලසුම් කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද වෙන් කිරීමට කටයුතු කර ගෙන යනු ලැබේ.

ආචාර්යවරුන්ගේ න්‍යායාත්මක හා පර්යේෂණාත්මක කුසලතා වර්ධනය කිරීම සඳහා පර්යේෂණ පත්‍රිකා පළ කිරීම,ශාස්ත්‍රීය ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීම, ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා පැවැත්වීම වැනි කාර්යයන් ඉටු කිරීමට සැලසුම් කර තිබේ. එමෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුහුණුව සඳහා ඒ ඒ වෘත්තීන්ට අදාළ වැඩිදුර පුහුණුව ලබා දීමටත් සැලසුම් කර ඇත.

භෞතික සම්පත් සංවර්ධනය යටතේ භාෂා අධ්‍යයන පීඨය සහ නේවාසිකාගාර ගොඩනැගිල්ල (දෙවන අදියර) ඉදිකිරීමේ කටයුතු 2011 වසර තුළ ආරම්භ කර ඇත . මීට අමතරව නව විශ්වවිද්‍යාල භූමියේ ඉදිකිරීමට යෝජිත අභ්‍යන්තර මාර්ග පද්ධතිය විදුලි පද්ධතිය හා ජල සැපයුම් පද්ධතිය 2012 වසර තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

මෙම විශ්වවිද්‍යාලයයේ කටයුතු පුළුල්වීම යටතේ පීඨ ඇති කිරීම හා මානව සම්පත් සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. විශේෂයෙන් අධ්‍යයන සහ අනධ්‍යයන යන අංශ දෙකේම කාර්ය මණ්ඩලය වැඩි කිරීම සිදු කළ යුතුව ඇත. ඒ අනුව ආධුනික කථිකාචාර්ය, නියෝජ්‍ය ලේඛකාධිකාරි, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි, සහකාර ලේඛකාධිකාරි, පරිගණක යෙදවුම් සහකාර, පෙදරේරු, වඩුකාර්මික, ජලනල කාර්මික හා කම්කරු තනතුරු ඇති කොට ඒවාට සුදුසු පුද්ගලයින් බඳවා ගැනීමට ඉදිරි වසර තුළ දී සිදු කිරීමට බලාපොරොත්තු වේ.

ඉදිරි වසරේ දී නව බාහිර පාඨමාලාවන් කිහිපයක් හඳුන්වා දීමට ද සැලසුම් සකස් වෙමින් පවති.

## 04. විශ්වවිද්‍යාලයයේ සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර : 2011

| පවතින අංශ | පාඨමාලාව | සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ අධ්‍යයන කාර්ය මණ්ඩලය | සම්පූර්ණ අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය | 157 | 30 | 49 |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | 43 | | |
| එකතුව | | 200 | 30 | 49 |

## 05. දේශීය සිසුන් පිළිබඳ විස්තර

| අධ්‍යයන අංශ | පාඨමාලාව | මාධ්‍ය | 2011 අධ්‍යයන වර්ෂය සඳහා නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව | පළමු වසර ශිෂ්‍ය සංඛ්‍යාව | දෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | තෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | සිව්වන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | උපාධිය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව * |
|---|---|---|---|---|---|---|---|---|
| සියලුම අධ්‍යයන අංශ | ශාස්ත්‍රවේදී සාමාන්‍ය/ විශේෂ | සිංහල | 100 | 69 | 44 | 55 | 20 | |
| | | ඉංග්‍රීසි | - | 06 | 03 | 03 | - | |
| එකතුව | | | 100 | 75 | 47 | 58 | 20 | |

* ශිෂ්‍ය අරගල පැවති නිසා විභාග පවත්වා නැත.

## 07. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අධ්‍යයන අංශ | විෂය | මාධ්‍ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ජ්‍යෙ.ස. පුස්තකාලයාධිකාරී | කථිකාචාර්ය | ආධුනික කථිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන අංශය | | සිංහල /ඉංග්‍රිස | 01 | 03 | | 01 | 02 | - |
| භාෂා අධ්‍යයන අංශය | | | 02 | 03 | | | 02 | 02 |
| සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය | | | 01 | 03 | | 01 | 02 | |
| ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය | | | | - | | 01 | 03 | 02 |
| | | | - | - | 01 | - | - | - |
| **එකතුව** | | | 04 | 09 | 01 | 03 | 09 | 04 |

## 07.1 බාහිර කථිකාචාර්ය වරුන් පිලිබඳ විස්තරය

| අධ්‍යයන අංශ | මාධ්‍ය | බාහිර කථිකාචාර්ය |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන අංශය | සිංහල/ඉංග්‍රිසි | 02 |
| භාෂා අධ්‍යයන අංශය | | 04 |
| සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය | | 07 |
| ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය | | 02 |
| **එකතුව** | | **15** |

## 08. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අංශ | විධායක නිලධාරි | ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| ආයතන හා පාලන අංශය | 02 | 04 | 10 |
| මූල්‍ය හා පරිපාලන අංශය | 02 | 05 | - |
| විභාග අංශය | - | 02 | - |
| පුස්තකාලය | - | 01 | 03 |
| ශිෂ්‍ය සේවා, නඩත්තු හා මූලධන අංශය | 01 | 05 | 03 |
| අධ්‍යයන හා බාහිර විභාග අංශය | 01 | 04 | 04 |
| අභ්‍යන්තර විගණන අංශය | 01 | - | 01 |
| **එකතුව** | **07** | **21** | **21** |

## 09. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රකාශයට පත් කළ සංඛ්‍යාව | වෙළෙඳපළට නිකුත් කළ සංඛ්‍යාව | දේශීය/විදේශීය සම්මන්ත්‍රණ සඳහා ඉදිරිපත් කළ සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 10 | | 08 |
| ආ. සඟරා සංඛ්‍යාව | 02 | 01 | 02 |
| ඇ. පොත් සංඛ්‍යාව | 04 | 02 | 02 |
| ඉ. ලිපි සංඛ්‍යාව | 62 | - | - |
| ඊ. වෙනත් (සම්මන්ත්‍රණ පත්‍රිකා) | | | 02 |
| **එකතුව** | **78** | **03** | **14** |

විස්තරාත්මක සටහන් ඇමුණුම් i බලන්න.

## 10. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | සහභාගී වූ සංඛ්‍යාව | සම්පූර්ණ කළ සංඛ්‍යාව | ඉදිරිපත් කළ සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. උපාධි වැඩසටහන් සංඛ්‍යාව | - | - | |
| • සාමාන්‍ය කලා යෝග්‍යතා පරීක්ෂණය (2011/2012) | 170 | - | - |
| • ශාස්ත්‍රවේදී උපාධි i පාඨමාලා (2010/2011) | 84 | - | - |
| • ශාස්ත්‍රවේදී උපාධි ii පාඨමාලා (2009/2010) | 85 | - | - |
| ආ. ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | | | |
| • ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව ( 2010/2011) | - | 12 | - |
| • ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව ( 2011/2012) | 38 | - | - |

| | | | |
|---|---|---|---|
| • බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | - | 28 | - |
| • බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව (2011/2012) | 34 | - | - |
| ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව | | | |
| • ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව (2010/2011) | - | 01 | - |
| • ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව (2011/2012) | 20 | - | - |
| • කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව | 20 | - | - |
| • පරිගණක සහතිකපත්‍ර පාඨමාලාව - 2 වන කණ්ඩායම | 10 | - | - |
| • පරිගණක සහතිකපත්‍ර පාඨමාලාව - 3 වන කණ්ඩායම | 13 | | |
| ඊ. වෙනත් | | | |
| • මූලික ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව (2010/2011) | - | 08 | |
| • මූලික ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව (2011/2012) | 12 | - | |
| **එකතුව** | **486** | **49** | |

## 12. 1 ආරම්භ කර ඇති නව පාඨමාලා සම්බන්ධ විස්තර (බාහිර)

| අංශය | පාඨමාලාව | මාධ්‍යය | පදනම් පාඨමාලාව | සහතික පත්‍ර | ඩිප්ලෝමා | ශාස්ත්‍රවේදී සාමාන්‍ය පළමු පරීක්ෂණය |
|---|---|---|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන අංශය | බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | | | 34 | |
| | උපාධි පාඨමාලාව | සිංහල | | | | 170 |
| භාෂා අධ්‍යයන අංශය | ඉංග්‍රීසි පාඨමාලාව | සිංහල | 13 | 20 | 37 | |
| ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය | සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ | සිංහල | | | 10 | |
| **එකතුව** | | | **13** | **20** | **81** | **170** |

## 13. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2010 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| අ. පෞද්ගලික පඩි නඩි | **39,765,759.00** | **51,110,318.00** |
| ආ. දේශීය/විදේශීය ගමන් වියදම් | **754,138.00** | **1,244,640.00** |
| ඇ. සැපයුම් | **2,868,290.00** | **2,780,727.00** |
| ඈ. නඩත්තු | **1,244,431.00** | **1,414,390.00** |
| ඉ. ගිවිසුම්ගත සේවා | **6,829,792.00** | **10,432,602.00** |
| ඊ. වෙනත් | **6,147,418.00** | **3,862,406.00** |
| **එකතුව** | **57,609,828.00** | **70,845,083.00** |

## 14. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2010 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| අ. ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම | **7,268,532.00** | **3,442,243.00** |
| ආ. යන්ත්‍ර මිලදී ගැනීම් | **1,266,269.00** | **1,215,382.00** |
| ඇ. ගොඩනැගිලි සහ ඉදිකිරීම් | **91,364,385.00** | **123,688,115.00** |
| ඈ. වෙනත් (ගොඩනැගිලි සහ පුනරුත්තාපන) | **2,144,715.00** | **-** |
| පොත් | **1,016,303.00** | **974,443.00** |
| වාහන | **-** | **10,208,120.00** |
| **එකතුව** | **103,060,204.00** | **139,528,303.00** |

## 15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය අරමුදල්)

| ව්‍යාපෘතියේ නම හා විස්තර | ණය / ප්‍රදානයන් | අරමුදල් සැපයු ආයතනය | ඇස්තමේන්තු ගත මුළු වියදම (රු)මිලියන | RFA | DF |
|---|---|---|---|---|---|
| 1. පරිපාලන ගොඩනැගිල්ල | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 103.0 | | |
| 2. ශිෂ්‍ය නේවාසිකාගාරය 1 | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 19.6 | | |
| 3. බෞද්ධ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 268.0 | | |
| 4. ට්‍රාන්ස්ෆෝමර් කාමරය | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 0.5 | | |
| 5. නව පරිපාලන ගොඩනැගිල්ල ආශ්‍රිත කොටසේ භූමි සැලසුම් හා අලංකරණය | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 0.5 | | |
| 6. ප්‍රධාන ගේට්ටුවේ සිට මායිම් තාප්පය ඉදිකිරීම - 1 අදියර | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 2.0 | | |
| 7. පිවිසුම් දොරටු අංක 02 ඉදිකිරීම | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 1.7 | | |
| 8. අභ්‍යන්තර මාර්ග පද්ධතිය - 1 අදියර | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 5.0 | | |
| 9. ජල ටැංකිය හා ඊට අදාළ ඉදිකිරීම් | | ශ්‍රී ලංකා රජයේ ආධාර | 13.7 | | |
| **එකතුව** | | | 414.0 | | |

## 16. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර( දේශීය/විදේශීය අරමුදල් )

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුළු වියදම(රු.) මිලියන | 2010 වසර තුළ වියදම (රු.) මිලියන | 2011 වසර තුළ වියදම (රු.) මිලියන | 2011.12.31 දිනට මුළු වියදම (රු.) මිලියන | භෞතික ප්‍රගතිය (ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|---|
| 1. පරිපාලන ගොඩනැගිල්ල | 103.0 | 31.5 | - | 79.9 | 100% |
| 2. ශිෂ්‍ය නේවාසිකාගාරය 1 | 19.6 | 11.3 | - | 17.2 | 100% |
| 3. බෞද්ධ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල | 268.0 | 38.5 | 71.6 | 110.1 | 34% |
| 4. ට්‍රාන්ස්ෆෝමර් කාමරය | 0.5 | - | 0.5 | 0.5 | 100% |
| 5. නව පරිපාලන ගොඩනැගිල්ල ආශ්‍රිත කොටසේ භූමි සැලසුම් හා | 0.5 | - | 0.6 | 0.6 | 100% |
| 6. ප්‍රධාන ගේට්ටුවේ සිට මායිම් තාප්පය ඉදිකිරීම - 1 අදියර | 2.0 | - | 1.2 | 1.2 | 75% |
| 7. පිවිසුම් දොරටු අංක 02 ඉදිකිරීම | 1.7 | - | 1.2 | 1.2 | 100% |
| 8. අභ්‍යන්තර මාර්ග පද්ධතිය - 1 අදියර | 5.0 | - | 1.0 | 1.0 | 2% |
| 9. ජල ටැංකිය හා ඊට අදාළ ඉදිකිරීම් | 13.7 | - | 2.4 | 2.4 | 2% |

විස්තරාත්මක සටහන් ඇමුණුම් ii බලන්න.

## 17. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

| විෂයය | 2011 වසරේ ඇස්තමේන්තුව (රු) | 2011 තුළ වියදම් (රු) | ඉතිරිය/අතිරේක ප්‍රමාණය (රු.) |
|---|---|---|---|
| අ. පුනරාවර්තන වියදම් (ව්‍යාපෘති) | - | - | - |
| ආ. මූලධන වියදම් (ව්‍යාපෘති) | - | - | - |
| ඇ. ව්‍යාපෘති දේශීය අරමුදල් * | 329,046,000 | 210,338,925 | 118,708,925 |
| ඈ. ව්‍යාපෘති විදේශීය අරමුදල් | - | - | - |
| **එකතුව** | **329,046,000** | **210,338,925** | **118,708,925** |

* පුනරුත්ථාපන, ප්‍රාග්ධන

**18. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර 2011 (ඉපයූ ආදායම)**

| විෂය | | ලැබීම් | වියදම් | ඉතිරිය/අතිරේක ප්‍රමාණය (රු) |
|---|---|---|---|---|
| බාහිර ඉංග්‍රීසි පාඨමාලාව | | 776,878.00 | 508,432.00 | 268,446.00 |
| බාහිර සන්නිවේදන හා තොරතුරු තාක්‍ෂණ පාඨමාලාව | | 78,350.00 | 48,260.00 | 30,090.00 |
| බාහිර උපාධි පාඨමාලාව | GAQ | 705,155.00 | 336,769.00 | 368,386.00 |
| | ප්‍රථම I | 419,860.00 | 329,912.50 | 89,947.50 |
| බාහිර කළමනාකරණ පාඨමාලාව | | 291,200.00 | 141,105.00 | 150,095.00 |
| බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව | | 173,080.00 | 106,370.00 | 66,710.00 |
| සන්නිවේදන හා තොරතුරු තාක්‍ෂණ පාඨමාලාව | | 80,300.00 | 45,930.00 | 34,370.00 |
| **එකතුව** | | 2,524,823.00 | 1,516,778.50 | 1,008,044.50 |

**19. මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය - 2011**

| විෂය | ගණනය කළ ආකාරය | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පිරිවැය (පුනරාවර්තන වියදමින්) | පුනරාවර්තන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව | **354,225.00** |
| ආ. ඒක ශිෂ්‍ය පිරිවැය (මූලධන වියදමින්) | මූලධන වියදම/ශිෂය සංඛාව | **697642.00** |
| **එකතුව** | | **1,051,867.00** |

**20. 2011 වසර තුළ ලැබී ඇති යටිතල පහසුකම් පිළිබඳ විස්තර**

| | යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම (රු.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | දේශන ශාලාවේ 06 කාමරය පරිගණක මධ්‍යස්ථානයක් ලෙස නවීකරණය | රු. 578.621.54 | 100% |
| 2 | මානමුනාවත්ත ඉඩමේ ශිෂ්‍ය නේවාසිකාගාරයට මුළුතැන්ගෙයක් ඉදිකිරීම | රු. 1,337,359.02 | 100% |
| 3 | පුස්තකාලයට ඇළුමිනියම් දොරක් සවිකිරීම | රු. 129,122.24 | 100% |
| 4 | විශ්වවිද්‍යාලයට නාම පුවරු 04ක් ඉදිකිරීම | රු. 143,640.00 | 100% |
| 5 | ශිෂ්‍ය නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම | රු. 402,201.03 | 100% |
| 6 | කැඩී බිඳී ඇති ප්‍රධාන ජල ප්‍රවාහන කාණුව ඉවත් කර අළුතින් ජල ප්‍රවාහ කාණුවක් ඉදි කිරීම | රු. 548,222.07 | 100% |
| 7 | කථිකාචාර්ය නේවාසිකාගාරයේ කාමර අංක 16, 17 ඇළුමිනියම් පාටිෂන් කිරීම | රු. 59,146.14 | 100% |
| 8 | නව නේවාසිකාගාරයේ උපශාලාධිපති කාමරයට නාන කාමරයක් ඉදි කිරීම | රු. 226,673.80 | 100% |
| 9 | නව ශිෂ්‍ය නේවාසිකාගාරයේ ජනෙල්වලට යකඩ ග්‍රිල් සපයා සවි කිරීම | රු. 341,236.07 | 100% |

| | | | |
|---|---|---|---|
| 10 | නව පරිපාලන ගොඩනැගිල්ලේ දෙවන මහළ සඳහා පැන්ට්‍රියක් ඉදිකිරීම | රු. 141,107.41 | 100% |
| 11 | සංචාරක නිවාසය සඳහා වානේ වතුර ටැංකි ආධාරකයක් ඉදි කිරීම | රු. 97,144.65 | 100% |
| 12 | සංචාරක නිවාසයේ නාන කාමරයක් අළුත්වැඩියා කිරීම | රු. 99,684.70 | 100% |
| 13 | බස් රථය සඳහා නව විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ගරාජයක් ඉදි කිරීම | රු. 1,130,629.81 | 100% |
| 14 | නව ශිෂ්‍ය නේවාසිකාගාරය වටා පෙරසවි තාප්පයක් ඉදි කිරීම | රු. 2,289,992.32 | 100% |
| 15 | නව විශ්වවිද්‍යාල පරිශ්‍රයේ උපශාලාධිපති කාමරයේ ජනෙල්වලට යකඩ ග්‍රිල් සපයා සවි කිරීම | රු. 52,791.91 | 100% |
| 16 | පැරණි අධ්‍යයන අංශ ගොඩනැගිල්ලේ පැන්ට්‍රිය නාන කාමරයක් ලෙස නවීකරණය කිරීම | රු. 84,454.65 | 100% |

**21. මෙම වාර්තාවට අදාළ වෙනත් විස්තර/කාර්ය සාධනයන් :**

**අ. පුස්තකාලය පිළිබඳ තොරතුරු :**

**<u>පුස්තකාල වාර්තාව</u>**

**I. පුස්තකාල සාමාජිකයින් පිළිබඳ විස්තර - 2011**

| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජික සංඛ්‍යාව | අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| 167 | 30 | 49 |

**II. පුස්තකාලය පරිහරණය කළ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර - 2011**

| පළමු වසර | දෙවන වසර | තෙවන වසර | සිව්වන වසර |
|---|---|---|---|
| 48 | 60 | 47 | 12 |

**III. ලැබී ඇති යටිතල පහසුකම් පිළිබඳ විස්තර - 2011**

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම (රු) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| මිල දී ගැනීම්<br>පොත් -<br>පුස්තිකා - 22 | **974,443.00** | 705 |
| පරිගණකයන්ත්‍ර | 197,800.00 | 02 |
| පරිගණක රූදවුම් | 6,280.00 | 02 |

## බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
## අනුමත සේවක සංඛ්‍යාව - 2011-12-31 දිනට

අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

| | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | මහෝපාධ්‍යාය | 01 | 01 | - |
| 02 | මහාචාර්ය | 04 | 01 | 03 |
| 03 | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි | 01 | 01 | - |
| 04 | කථිකාචාර්ය | | | |
| | i. මහාචාර්ය | 27 | 02 | - |
| | ii. සහාය මහාචාර්ය | | 01 | - |
| | iii. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | | 05 | - |
| | iv. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | | 03 | - |
| | v. කථිකාචාර්ය | | 01 | - |
| | vi. ආධුනික කථිකාචාර්ය | | 12 | 03 |
| 05 | පරිගණක උපදේශක | 01 | 01 | - |
| 06 | ඉංග්‍රීසි උපදේශක | 02 | 02 | - |
| 07 | බෞද්ධ උපදේශක | 01 | - | 01 |
| | **එකතුව** | **37** | **30** | **07** |


අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | ලේඛකාධිකාරි | 01 | 01 | - |
| 02 | මූල්‍යාධිකාරි | 01 | 01 | - |
| 03 | පුස්තකාලයාධිකාරි | 01 | - | 01 |
| 04 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 01 | 01 | - |
| 05 | සහකාර ලේඛකාධිකාරි | 03 | 02 | 01 |
| 06 | සහකාර මූල්‍යාධිකාරි | 01 | 01 | - |
| 07 | සහකාර අභ්‍යන්තර විගණක | 01 | 01 | - |
| 08 | උපශාලාධිපති | 02 | 02 | - |
| 09 | පෞද්ගලික ලේකම් (මහෝපාධ්‍යායය) | 01 | - | 01 |
| 10 | වැඩ අධිකාරි | 01 | 01 | - |
| 11 | ලඝු ලේඛක (ඉංග්‍රීසි) | 01 | 01 | - |
| 12 | ලඝු ලේඛක (සිංහල) | 02 | 02 | - |
| 13 | පරිගණක යෙදවුම් සහකාර | 07 | 03 | 04 |
| 14 | ලිපිකරු | 06 | 05 | 01 |
| 15 | පුස්තකාල සහකාර | 02 | 01 | 01 |
| 16 | පොත් තබන්නා | 01 | 01 | - |
| 17 | මුදල් අයකැමි | 01 | 01 | - |
| 18 | ගබඩා භාරකරු | 01 | 01 | - |
| 19 | සිවිල් පරිපාලක | 01 | 01 | - |
| 20 | පිළිගැනීම් නිලධාරි/ දුරකථන ක්‍රියාකරු | 01 | 01 | - |
| 21 | පුහුණුවන කාර්මික නිලධාරි | 01 | 01 | - |
| 22 | කම්කරු | 12 | 11 | 01 |
| 23 | සංචාරක නිවාස භාරකරු | 01 | 01 | - |
| 24 | අරක්කැමි | 03 | 01 | 02 |
| 25 | විදුලි කාර්මික | 01 | 01 | - |
| 26 | රියදුරු | 07 | 04 *** | 03 |
| 27 | කාර්යාල කාර්ය සහායක | 03 | 03 | - |
| 28 | ආරක්ෂක පරීක්ෂක | 02 | - | 02 |
| | **එකතුව** | **66** | **49** | **17** |

*** අනියම් රියදුරු දෙදෙනෙක් ඇතුළත්ව


## බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
### අධ්‍යයන කාර්ය මණ්ඩලය 2011

| තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛනව |
|---|---|---|---|
| මහෝපාධ්‍යායයන් වහන්සේ | **1** | **1** | |
| මහාචාර්ය | **4** | **1** | **3** |
| කථිකාචාර්ය | **28** | **24** | **4** |
| සහකාර පුස්තකාලයාධිකාරි | **1** | **1** | |
| පරිගණක උපදේශක | **1** | **1** | |
| ඉංග්‍රිසි උපදේශක | **2** | **2** | |
| එකතුව | **37** | **30** | **7** |




# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
## අනධ්‍යයන කාර්ය මණ්ඩලය 2011


| තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛනව |
|---|---|---|---|
| විධායක | **9** | **7** | **2** |
| විධායක නොවන | **30** | **21** | **9** |
| සුළු සේවක | **27** | **21** | **6** |
| එකතුව | **66** | **49** | **17** |




## බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
## ඒක ශිෂ්‍ය වියදම

| වර්ෂය | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|
| 2007 | 224924 |
| 2008 | 210015 |
| 2009 | 218219 |
| 2010 | 262216 |
| 2011 | 354225 |













# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
## ශිෂ්‍ය බඳවා ගැනීම්
**පසුගිය වසර 05 තුළ**


| වර්ෂය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| **2007** | **103** | **206** |
| **2008** | **98** | **243** |
| **2009** | **63** | **264** |
| **2010** | **53** | **222** |
| **2011** | **93** | **200** |















## බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
### උපාධි සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව
පසුගිය වසර 05 තුළ

| වර්ෂය | ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) | ශාස්ත්‍රවේදි (විශේෂ) | එකතුව |
|---|---|---|---|
| **2006** | **20** | **4** | **24** |
| **2007** | **43** | **14** | **57** |
| **2008** | **14** | **12** | **26** |
| **2009** | **32** | **17** | **49** |
| **2010** | **78** | **18** | **96** |
| **2011** | විභාගය පවත්වා නැත | | |



**2011 වර්ෂය සඳහා වූ බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සඳහා වූ ව්‍යවස්ථාපිත වාර්තාව**

01. 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 46 වගන්ති ප්‍රකාරව හා 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති ප්‍රකාරව 2011 වර්ෂයේ ගිණුම් වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

02. ගිණුම් වාර්තාව පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී පිළිපැදිය යුතු සංකල්ප වන අඛණ්ඩ පැවැත්ම අනුරූපි බව උපචිත අදාළ බව, යන පොදුවේ පිළිගත් ගිණුම් සංකල්ප නියමයන් හා ප්‍රමිතීන් භාවිතකොට ගිණුම් පිළියෙල කර, ඉදිරිපත් කර ඇත.

03. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයයේ 2011 වර්ෂයේ ගිණුම් වාර්තාවෙන් පැහැදිලි වන පහත සඳහන් සටහන් උපුටා දක්වනු ලැබේ. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයට පුනරාවර්තන හා මූලධන ආධාර වශයෙන් රජයෙන් රු. 214,157,000.00 ක මුදලක් ලැබී ඇත.

| | | | | |
|---|---|---|---|---|
| i. | රජයේ ආධාර | • පුනරාවර්තන | රු. | 70657000.00 |
| | | • මූලධන වත්කම් පුනරුත්ථාපන | රු. | 143500000.00 |
| | | | රු. | 214157000.00 |

ii. පවත්නා වර්ෂයේ පුනරාවර්තන වියදම් ඌනතාව රු. 14,853,726.00 කි. (මෙය ස්ථාවර වත්කම් ක්ෂය වෙන්කිරීම් හා උපචිත වියදම් සහිතව)

iii. විශ්වවිද්‍යාලයයේ සේවකයන් සඳහා රු. 8,802,818.74 ක් ණය අරමුදල යටතේ ණය දී ඇත. ඒ සඳහා ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල ඇප වශයෙන් ඇත.

iv. වසරේ ආයෝජන වශයෙන් රාජ්‍ය බැංකුවල රු. 7,252,682.00 මුදලක් තැන්පත් කර ඇත. එම මුදල් පර්යේෂණ හා පරිත්‍යාග වශයෙන් ලැබී ඇති මුදල්වලින් නියෝජනය වේ. පර්යේෂණ අරමුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ රු. 2,592,299.00 ක් ද, ත්‍යාග අරමුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ රු. 308,613.00 ක් ද, මහෝපාධ්‍යයය අරමුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ රු. 1,446,416.00 ක් ද, පරිත්‍යාග අරමුදල් මහජන බැංකුවේ රු. 371,920.00 ක් ද, බාහිර පාඨමාලා මුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ රු. 2,500,000.00 ක්ද, වෙනත් මුදල් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ රු. 33,434.00 ක් ලෙසද ආයෝජනය කර ඇත.

v. වර්ෂයේ බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයයේ අභ්‍යන්තර කටයුතුවලින් රු. 2,681,208.00 ක මුදලක් උපයාගෙන ඇත.

vi. ස්ථාවර වත්කම් කෙරෙමින් පවතින වැඩද සහිතව රු. 352,234,619.00 ක ශුද්ධ අගයක් නියෝජනය වේ.

vii. ගබඩා තොග ශේෂය රු. 1,147,965.27 වන අතර, මෙය වර්ෂ අවසාන භෞතික තොග සමීක්ෂණ වාර්තාව මගින් තහවුරු කර ඇත. තොග නිකුත් කරනු ලබන්නේ FIFO ක්‍රමයටය.

viii. වර්ෂ අවසානයේ බැංකු ශේෂය රු. 8,727,906.62 වන අතර, එය උපචිත වියදම් වෙනුවෙන් ඊළඟ වර්ෂයේ මුල් කාර්තුව තුල සම්පූර්ණයෙන් වැය කර ඇත. බැංකු ශේෂය ගිණුම් සමඟ තුලනය වන අතර, ඒ බව ශේෂ සහතිකයකින් සනාථ කරගෙන තිබේ.

04. 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 10 වගන්තියට අනුව සේවක අර්ථසාධක අරමුදල විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලැබේ. ඒ සඳහා වන ගිණුම් වාර්තා වෙනම ම පිළියෙල කරනු ලැබේ.

05. පුනරාවර්තන වැය ශීර්ෂයන් හි සත්‍ය වියදම්වල විචල්‍යයන්, පාලක සභාවේ අනුමැතිය ඇති ව, ප්‍රතිපාදන ගලපා තුලනය කර තිබේ.

06. භාණ්ඩාගාරය එයින් ඍජුවම මෙම විශ්වවිද්‍යාලයට ලබා දෙන ලද වාහන 2 හි වටිනාකම විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් වලට ඇතුළත් කරන ලදි. (රු. 13,500,000.00)

07. සම්පූර්ණයෙන්ම ක්ෂය ප්‍රතිපාදන සැලසීම නිසා ශේෂ වටිනාකමක් නොපෙන්වන ස්ථාවර වත්කම්වල ප්‍රත්‍යාගණන වටිනාකම, මෙතෙක් ගණනයකර නොමැත.

08. විශ්වවිද්‍යාලය සතුව තිබූ වාහන 2 ක් මෙම කාලය තුල අපහරණය කරන ලද අතර, එමගින් ලද රු.586,500.00 ක මුදල මහා භාණ්ඩාගාරයට යවන ලදි.

09. විශ්වවිද්‍යාල නව පරිශ්‍රයේ ඉදිකිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ලබා ගතයුතු සැලසුම් අනුමතය සඳහා ගෙවන ලද 1% සේවා ගාස්තුව 6,933,712.00 ක ඉදිකිරීම් කටයුතු නොනිමි බැවින් කෙරීගෙන යන වැඩ ගිණුමේ පෙන්වා ඇත.

**<u>බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයයේ 2011 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරනු ලබන මුදල් තත්ත්ව ප්‍රකාශනය සඳහා වූ ගිණුම් සටහන්.</u>**

01 2011 වර්ෂය සඳහා බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය වෙනුවෙන් මූලධන ආධාර රු. 143,500,000.00 රජයේ ප්‍රතිපාදන ලෙස ලැබී ඇත.

02 මිල දී ගත් ස්ථාවර වත්කම් සරල මාර්ග ක්ෂය ක්‍රමය යටතේ පහත සඳහන් පරිදි ක්ෂය ගණනය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 05% |
| කාර්යාලයීය උපකරණ | 20% |
| ඉගැන්වීමේ උපකරණ | 20% |
| පුස්තකාල පොත් | 20% |
| දැව භාණ්ඩ | 10% |
| අභ්‍යන්තර දුරකථන පද්ධතිය | 20% |
| යන්ත්‍ර හා පිරියත | 10% |
| මෝටර් වාහන | 20% |
| ජල සැපයුම් පද්ධතිය | 10% |
| මෙවලම් හා උපකරණ | 20% |
| පරිගණක මෘදුකාංග | 20% |
| ආරක්ෂිත විදුලි පහන් පද්ධතිය | 10% |
| උපාධි ලෝගු | 20% |
| නාම පුවරු | 10% |
| අභ්‍යන්තර මාර්ග පද්ධති | 10% |
| පරිගණක දෘඩාංග | 20% |

03 ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 අනුව පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් කර ඇත. 2011.12.31 දිනට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 11,672,686.00 ක. ( සත්‍ය වියදම ගණනය කර ගැනීම සඳහා සේවකයින්ගේ පළමු වර්ෂයේ සිටම ප්‍රතිපාදන සලසා තිබේ.)

04. **නව පරිපාලන ගොඩනැගිල්ල**
නව විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිකරන ලද සනාතන මන්දිරය ඉදි කිරීම් නිමවා මේ වන විට විශ්වවිද්‍යාලයට භාර දී තිබේ. එහෙත් එහි අවසාන බිල්පත උපදේශකවරුන් විසින් සහතික කොට මෙතෙක් ලබා දී නැති බැවින් ගෙවීම් කර ද නො මැත. එසේද වුවත් විශ්වවිද්‍යාලය සතු වත්කම්වල සත්‍ය වටිනාකම නිරූපනය කිරීමේ අරමුණින් අවසාන බිල්පතේ වටිනාකම ගොඩනැගිලි ගිණුමට එකතුකරන ලදී. ගෙවිය යුතු හිඟ මුදල ණය හිමියන් යටතේ පෙන්වා ඇත.

05. **විශ්වවිද්‍යාලයේ අර්ථසාධක අරමුදල**
විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් පනතේ විධානවලට අනුව වෙනම අර්ථසාධක අරමුදලක් පවත්වාගෙන යනු ලැබේ.

06. **ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු මුදල්**
ගිවිසුම් කඩකල ආචාර්යවරුන් 02කු ගෙන් බැදුම්කර වටිනාකමෙන් ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් අයකළ හැකි ප්‍රමාණය සම්පූර්ණයෙන් අයකර ගිණුම්වලට ගෙන ඇත. පොල්පිටියේ ඤාණරංසි හිමිගෙන් රු.527,693.94 ක් හා පිතිකහනේ මෛත්‍රී හිමිගෙන් රු. 252,200.64 ක් වශයෙන් අයවිය යුතුව ඇති මුදල් ඒ හා අදාල නඩුකර නොනිමි බැවින් ගිණුම්වලට ගෙන නැත.

07. රු.19,220.50 ක් වටිනා විනාශ කිරීමට නිර්දේශකර ඇත. එහෙත් මෙතෙක් විනාශ නොකරන ලද භාණ්ඩ ඉතිරි තොග වශයෙන් තිබෙන්නට ඉඩ හරින ලදි.

08. සම්පූර්ණයෙන්ම ප්‍රතිපාදන සැලසී ශේෂ වටිනාකමක් නොපෙන්වන වත්කම් විශ්වවිද්‍යාලය සතුවන අතර ඒවා ප්‍රත්‍යාගණනය කරවා ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.

09. මෙම වර්ෂය තුළ දී ගෙවීමට නියමිත වූ 2006 සිට හිඟ අර්ථසාධක හා සේවා නියුක්ති භාර අරමුදල් දායකය දැනට සේවයේ නියතු සෑම සේවකයෙකු සම්බන්ධයෙන්ම ගෙවීම් කරන ලදි. අස්ව ගොස් ඇති සේවකයින් සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා තිබේ.

10. පෙර වර්ෂයට අදාල වියදම් ගෙවීමේදී පාලක සභාවේ අනුමැතිය ඇතිව පොදු සංචිතයෙන් දරා තිබේ.

| | | |
|---|---|---|
| ජයසේන පයාගල, | ආර්.එම්.බී. මුතුබණ්ඩා, | පූජ්‍ය මහාචාර්ය කුඹුල්ලේ සීලක්ඛන්ධ ස්වාමින් වහන්සේ, |
| මුල්‍යාධිකාරී. | ලේඛකාධිකාරී. | මහෝපාධ්‍යායයන් වහන්සේ. |

# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | පිටු අංකය | පවත්නා වර්ෂය 2011.12.31 දිනට | | පෙර වර්ෂයේ 2010.12.31 දිනට | |
|---|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| ස්ථාවර වත්කම් | 309,283,336.60 | | | | | |
| අඩුකළා ක්ෂය වෙන්කිරීම් | 64,443,233.33 | 8-24 | 244,840,103.27 | | 201,510,723.31 | |
| කෙරීගෙන යන වැඩ | | 25 | 107,394,516.77 | | 149,472.40 | |
| ස්ථාවර තැන්පතු ගිණුම් | | 26 | 4,651,995.78 | | 2,132,854.55 | |
| ඉතිරි කිරීමේ ගිණුම් | | 27 | 2,600,686.29 | 359,487,302.11 | 2,367,366.40 | 206,160,416.66 |
| | | | | | | |
| **ජංගම වත්කම්** | | | | | | |
| විදුලිය ඇප තැන්පත් | | | 770,000.00 | | 770,000.00 | |
| ගොඩනැගිලි අත්තිකාරම් | | 28 | 23,377,063.06 | | 39,357,626.00 | |
| තොගය | | 29 | 1,147,965.27 | | 958,399.57 | |
| ණය ගැතියෝ | | 30 | 126.60 | | 152,984.89 | |
| ඉදිරියට කළ ගෙවීම් | | 31 | 467,552.49 | | 38,744.56 | |
| ණය සහ අත්තිකාරම් | | 32 | 8,802,818.74 | | 8,358,403.38 | |
| ණය සහ අත්තිකාරම් සැපයුම් | | | 143,483.00 | | 4,500.00 | |
| වෙනත් විශ්වවිද්‍යාල හා ආයතනවලින් - අයවියයුතු මුදල් | | 32 | 141,408.03 | | 268,464.71 | |
| මුදල් ශේෂය (බැංකු) | | 33 | 8,727,906.62 | 43,578,323.81 | 5,253,176.47 | 55,162,299.58 |
| ***මුළු වත්කම්*** | | | | **403,065,625.92** | | **261,322,716.24** |
| **ජංගම වගකීම්** | | | | | | |
| විවිධ ණය හිමියෝ | | 34 | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 20,807,900.07 | | 25,020,170.25 | |
| උපචිත වියදම් | 50A | 1,258,921.20 | | 2,270,538.58 | |
| සේවක ඇප හා වෙනත් තැන්පතු | 34 | 2,067,495.55 | | 2,424,740.70 | |
| නොනිමි බාහිර පාඨමාලා | 35 | 1,604,522.00 | | 1,883,723.00 | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශේෂ අරමුදල් | | 13,500,000.00 | | | |
| මහෝපාධ්‍යායයන් වහන්සේ ලද පරිත්‍යාග | 36 | 2,032,183.10 | | 2,032,183.10 | |
| ත්‍යාග අරමුදල් | 36 | 953,864.32 | | 950,785.37 | |
| ***මුළු වගකීම්*** | | | **42,224,886.24** | | **34,582,141.00** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **360,840,739.68** | | **226,740,575.24** |
| | | | | | |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| **ප්‍රාග්ධනය** | | | | | |
| ප්‍රාග්ධනිත වූ මූලධන ආධාර | 37 | 197,154,614.18 | **197,154,614.18** | 168,457,926.34 | **168,457,926.34** |
| **ශේෂ අරමුදල්** | | | | | |
| ප්‍රාග්ධනිත නොවූ මූලධන ආධාර | 37 | 157,581,694.37 | **157,581,694.37** | 40,322,946.37 | **40,322,946.37** |
| **සංචිත** | | | | | |
| විශේෂ සංචිත | 38-40 | 11,672,213.50 | | 9,133,322.00 | |
| ප්‍රාග්ධන සංචිත | | 1,174,347.29 | | 1,070,609.79 | |
| පොදු සංචිත | 4 | (7,502,322.32) | | 6,995,578.08 | |
| ගිවිසුම් කඩ කිරීමෙන් අයකළ මුදල් | | 760,192.66 | **6,104,431.13** | 760,192.66 | **17,959,702.53** |
| | | | **360,840,739.68** | | **226,740,575.24** |

ජයසේන පයාගල
මූලාධිකාරී

ආර්.එම්.බී. මුතුබණ්ඩා
ලේඛකාධිකාරී

පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්වාමීන් වහන්සේ
මහෝපාධ්‍යායයන් වහන්සේ

# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රියාකාරිත්ව වාර්තාව

| | පිටු අංකය | 2011 වර්ෂය | 2010 වර්ෂය |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | |
| පුනරාවර්තන ප්‍රතිපාදන | | 70,657,000.00 | 55,943,000.00 |
| පුනරුත්ථාපන ප්‍රතිපාදන | | 1,445,943.00 | 5,706,373.03 |
| ආයෝජන පොලී | | 266,042.01 | 256,307.51 |
| ණය පොලී | | 321,631.16 | 369,404.67 |
| දේපල කුලී | | 393,308.01 | 307,150.00 |
| විවිධ ආදායම් | | 478,456.28 | 633,044.04 |
| ශිෂ්‍ය ලියාපදිංචි (අභ්‍යන්තර) | | 110,000.00 | 195,800.00 |
| ශිෂ්‍ය ලියාපදිංචි (විදේශීය) | | | 11,010.16 |
| පුස්තකාල දඩ මුදල් | | 8,435.30 | 3,126.00 |
| නැණසල ආදායම් | | 2,501.00 | 695.55 |
| බාහිර පාඨමාලා ආදායම් 6110 සිට 6116,6121 | | 1,008,044.50 | 705,446.25 |
| වෙනත් ආදායම් (අබලි භාණ්ඩ අලෙවිය) | | 92,789.39 | 3,020.00 |
| මෙහෙයුම් ආදායම්වල එකතුව | | **74,784,150.65** | **64,134,377.21** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 7 | 51,110,318.30 | 39,821,265.32 |
| ගමන් වියදම් | 7 | 1,244,639.52 | 1,420,114.83 |
| සැපයුම් | 7 | 2,780,726.68 | 2,447,701.80 |
| නඩත්තු කටයුතු | 7 | 1,414,390.88 | 1,030,692.32 |
| ගිවිසුම් ගත සේවා | 7 | 10,432,602.47 | 7,699,363.93 |
| පුහුණු හා සංවර්ධන වියදම් | 7 | 461,383.00 | 676,481.78 |
| ශිෂ්‍යාධාර | 7 | 1,608,400.00 | 3,381,100.00 |
| විවිධ මෙහෙයුම් වියදම් | 7 | | |

| | | | |
|---|---|---|---|
| | | 1,781,602.97 | 1,735,264.45 |
| නැණසල වියදම් | | 11,020.32 | - |
| පුනරුත්ථාපන ප්‍රතිපාදන යටතේ දරන ලද පුනරාවර්තන ස්වභාවයේ වියදම් 4101-02 | | 1,445,943.31 | 5,706,373.03 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 8 | 17,346,849.66 | 11,117,769.71 |
| මෙහෙයුම් වියදම්වල එකතුව | | **89,637,877.11** | **75,036,127.17** |
| අතිරික්තය / ඌනතාව | | **(14,853,726.46)** | **(10,901,749.96)** |
| අදාල කාලය සඳහා දළ අතිරික්තය/ඌනතාව | | **(14,853,726.46)** | **(10,901,749.96)** |

ජයසේන පයාගල,
මූල්‍යාධිකාරී.

ආර්.එම්.බී. මුතුබණ්ඩා,
ලේඛකාධිකාරී.

පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ
ස්වාමීන් වහන්සේ,
මහෝපාධ්‍යායයන් වහන්සේ.

**2.6**

# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011 වසර | | 2010 වසර |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම ඉක්ම වූ අතිරික්ත /ඌනතාව | (14,853,726.46) | | (10,926,286.32) |
| **<u>මූල්‍ය නොවන වෙනස් වීම්</u>**<br>වසරේ ක්ෂය වීම් | 17,346,849.66 | | 11,142,306.13 |
| පාරිතෝෂික දීමනා වෙන් කිරීම | 2,538,891.50 | 5,032,014.70 | 899,580.50 |
| ජංගම වගකීම් වල වෙනස් වීම් | (5,857,254.76) | | 27,146,278.69 |
| ජංගම වත්කම් වල වෙනස් වීම් | 15,058,705.92 | 9,201,451.16 | (50,186,256.88) |
| මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 14,233,465.86 | (21,924,377.88) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (139,697,001.33) | | (57,996,206.37) |
| ස්ථාවර වත්කම් විකිණීම් 88204.44 | 143,022.99 | | |
| ආයෝජන වල වෙනස් වීම් (2519141.23) | (259,141.23) | | (389,492.28) |
| ඉතිරි කිරීම් ගිණුම් වල මුදල් තැන්පත් කිරීම්/ආපසු ගැනීම් (233319.89) | (233,319.89) | | (264,623.23) |
| ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ලැබීම් | 142,054,056.69 | (252,382.77) | 91,543,626.97 |
| ආයෝජන ක්‍රියාකාරිත්වයෙන් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 13,981,083.09 | 10,968,927.21 |
| මූල්‍ය ක්‍රියාකාරිත්වයෙන් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය<br>ආරම්භක මුදල් ශේෂය 01/01 දිනට | | 5,253,176.47 | 5,715,750.74 |
| අවසාන මුදල් ශේෂය 12/31 දිනට | | 8,727,906.62 | 5,253,176.47 |

සකස් කළේ　　　　　　　　　　පරීක්ෂා කළේ

# බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

2011 දෙසැම්බර් 31 දිනට පොදු සංචිතය 3104

| විස්තරය | උප ලේඛන අංකය | සමුච්චිත අරමුදල් රු. ශත | ප්‍රත්‍යාගණන සංචිත රු. ශත | පරිවර්තන සංචිත රු. ශත | එකතුව 2011 රු. ශත | එකතුව 2010 රු. ශත |
|---|---|---|---|---|---|---|
| 2010.12.31 දිනට ශේෂය | | 6,892,918.14 | | | 6,892,918.14 | 17,966,627.08 |
| වර්ෂයේ ගැලපීම | | 458,486.00 | | | 458,486.00 | (69,299.04) |
| | | 7,351,404.14 | | | 7,351,404.14 | 17,897,328.04 |
| වර්ෂයේ ඌණතාව | | (14,853,726.46) | | | (14,853,726.46) | (10,901,749.90) |
| 2011.12.31 දිනට ශේෂය | | (7,502,322.32) | | | (7,502,322.32) | 6,995,578.14 |

සකස් කළේ

පරීක්ෂා කළේ

## ඇමුණුම් i

### භාෂා අධ්‍යයන අංශය

01. **පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන හිමි,** "ත්‍රිපිටකධර්මය ග්‍රන්ථාරූඪ කිරීම, ඒ සඳහා බලපෑ හේතු සාධක සහ ඊට පුරෝගාමීවූවෝ කවරහුද? පිළිබඳ සොයා බැලීමක් "" සාධනප්පසාද ශාස්ත්‍රීය සංග්‍රහය" සංස්: මැදගම්පිටියේ විජිතධම්ම හිමි, මිරිස්වත්තේ විමලඤාණ හිමි, ජී. එම්. ප්‍රින්ටර්ස්, පිළියන්දල, 2011 නොවැම්බර්

02. **පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන හිමි,** "හෙළ සඳෙස්කවෙන් පෙනෙන සොබා සොඳුරු දසුන් "
"ගුරු පඬුරු" ශාස්ත්‍රීය ලිපි සරණිය, සංස්: සන්සුන්ගම ඤාණරතන හිමි, පී. ඩී. ප්‍රේමසිරි මහතා, මනෝරංජන හේරත් මහතා, ක්‍රියේටිව් ප්‍රින්ටර්ස් ඇන්ඩ් ඩිසයිනර්ස්, පේරාදෙණිය, 2011 ජනවාරි

03. **පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන හිමි,** "මහනුවර යුගයේ රචිත, රෝග මර්දනයට වෙදැදුරෙකු බඳු භේසජ්ජමඤ්ජුසා- සන්නයෙන් දැනගත හැකි රෝග ලක්ෂණ හා ප්‍රතිකාර" " සාරථී" වාර්ෂික සාර සංග්‍රහය, මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික දෙපාර්තමේන්තුව 2011"

04. **පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන හිමි,** "ධර්ම සංකල්ප පිළිබිඹු කරන සිංහල ව්‍යාඛ්‍යාන සාහිත්‍ය ග්‍රන්ථ පිළිබඳ විමර්ශනයක් ""මලියදේව ශාස්ත්‍රීය සංග්‍රහය" සංස්: මැදගම්පිටියේ විජිතධම්ම හිමි, දේවහන්දියේ සද්ධානන්ද හිමි, කරුණාරත්න සහ පුත්‍රයෝ, හෝමාගම, 2011 මාර්තු

05. **පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන හිමි,** "ශ්‍රී සම්බුද්ධත්ව අවස්ථාවේ ලොව මවිත කළ අසිරිමත් සිදුවීම් කෙබඳුද? ""ආලෝකෝදපාදි අතිරේකය, 'දිනමිණ ' පුවත්පත. 2011 අප්‍රේල් 27.

06. **පූජ්‍ය සහය මහාචාර්ය කරගස්වැවේ විමලානන්ද හිමි,** "සියම් මහා නිකාය", කුරුණෑගල ශාස්ත්‍රීය සංග්‍රහය, වයඹ පළාත් සභාවේ ප්‍රකාශනය. II කොටස

07. **පූජ්‍ය සහය මහාචාර්ය කරගස්වැවේ විමලානන්ද හිමි,** ''සංස්කෘත සාහිත්‍යය'', කුරුණෑගල ශාස්ත්‍රීය සංග්‍රහය, වයඹ පළාත් සභාවේ ප්‍රකාශනය. II කොටස

08. **පූජ්‍ය සහය මහාචාර්ය කරගස්වැවේ විමලානන්ද හිමි,** '' අනුරුද්ධ ශතකයේ විස්තරාත්මක අර්ථ ව්‍යාඛ්‍යානය. (පළමු ශ්ලෝක 12) ''ප්‍රවචන'' ශාස්ත්‍රීය සංග්‍රහය, බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය, 2011 වර්ෂය

09. **පූජ්‍ය ආචාර්ය කණුමුල්දෙණියේ චන්දසෝම හිමි, (2011).** සංස්කෘත භාෂාවේ සම්භවය හා පුරාණ ශ්‍රී ලංකාවේ සංස්කෘත සාහිත්‍යඃ ප්‍රවේශයක්, පිටු. 344-360. අතිපූජ්‍ය කුළුගම්මන ශ්‍රී ධම්මරක්ඛිතාභිධාන නායක ස්වාමීන්ද්‍ර අනුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය, වැලිවිට සොරත හිමි (සංස්කරණ)

10. **පූජ්‍ය ආචාර්ය කණුමුල්දෙණියේ චන්දසෝම හිමි, (2011).** ''පඤ්චතන්ත්‍රාගත ලබ්ධප්‍රණාශ තන්ත්‍රය පිළිබඳ විමර්ශනයක්''. නාහිමි උපහාර සංග්‍රහය. කැකිරාවේ පඤ්ඤාසේකර හිමි (සංස්කරණ)

11. **පූජ්‍ය ආචාර්ය කණුමුල්දෙණියේ චන්දසෝම හිමි, (2011).** ''පඤ්චතන්ත්‍රාගත ලබ්ධප්‍රණාශ ව්‍යාඛ්‍යාව'' අමුද්‍රිතයි.

12. **පූජ්‍ය ආචාර්ය කනංගමුවේ රාහුල හිමි,** **<u>Sri Lanka Jataka and secular Society</u>**, Department of **Taoism and Religious culture.** (Sichuan University) china PhD. Thesis 2011

13. **පූජ්‍ය ආචාර්ය කනංගමුවේ රාහුල හිමි,** ස්වභාවෝක්ත්‍යලංකාරය හා සිගිරි ගී **''අනු දීපනා''** අතිපූජ්‍ය කුළුගම්මන ශ්‍රී ධම්මරක්ඛිතාභිධාන නායක ස්වාමීන්ද්‍ර අනුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහ. මාගධී - පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන 2011 නොවැම්බර්

14. **පූජ්‍ය ආචාර්ය කනංගමුවේ රාහුල හිමි,** ගුරුළුගෝමීන්ගේ හා විද්‍යාචක්‍රවර්තීන්ගේ බුද්ධකාය සංවණ්ණනාව ලෝචන II කලාපය සඳහා ඉදිරිපත් කොට ඇත.

15. **පූජ්‍ය ආචාර්ය කනංගමුවේ රාහුල හිමි,** සහාය සංස්කාරක - **''අනු දීපනා''** අතිපූජ්‍ය කුළුගම්මන ශ්‍රී ධම්මරක්ඛිතාභිධාන නායක ස්වාමීන්ද්‍ර අනුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහ. මාගධී - පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන 2011 නොවැම්බර්

16. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** බෝධි වන්දනා ගාථා පිළිබඳ විමර්ශනයක්, ''මලියදේව ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. මැදගම්පිටියේ විජිතධම්ම හිමි, දේවහන්දියේ සද්ධානන්ද හිමි, කහටවිල ශ්‍රී පියදස්සි නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, 2011 මාර්තු

17. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** පටිච්චසමුප්පාදය - සර්වකාලීන පොදු ධර්මතාව, ''2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති ශාස්ත්‍රීය සංග්‍රහය'' සංස්. විජිත වෙලගෙදර, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2011 මැයි

18. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** සදාචාර සම්පන්න පුරවැසියෙකු බිහිකිරීමට අවශ්‍ය අධ්‍යාපනය, වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. අඹන්වැල්ලේ පියදස්සි හිමි, පදියපැලැල්ල මධ්‍යම මහා විද්‍යාලයීය වාර්ෂික සංග්‍රහය, 2011 සැප්තැම්බර්

19. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** ස්‍යාමොපසම්පදාව හා නායක පදවි, ''ශ්‍රී ආයුපාල නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය'' සංස්. වැල්ලැවේ ශ්‍රී චන්දානන්ද හිමි, කනත්තෙගොඩ සද්ධාරතන හිමි, පල්ලේවෙල 2011 සැප්තැම්බර්

20. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** සමන්තකූටවණ්ණනාව අන්තර්ගතය පිළිබඳ විවරණයක්, ''ප්‍රතිභා ප්‍රභා'' සංස්. නැහිනිවෙල පියදස්සි හිමි, ශාස්ත්‍රීය සංග්‍රහය, මල්වතු මහාවිහාරීය ශ්‍රී සංඝරාජ පිරිවෙන් ශාස්ත්‍රීය සංග්‍රහය. 2011 ඔක්තෝම්බර්

21. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** පාලි වංසකථා සාහිත්‍යය හා මහාවංසය, ''නැණස'' ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. බෝලැපේ කස්සප හිමි, කුරුණෑගල ආනන්ද හිමි, අස්ගිරි මහිවිහාර මහ පිරිවෙනේ වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය. 2011 ඔක්තෝම්බර්

22. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** සිරි රාම සන්දේශයේ දළඳා මන්දිරය හා තදාශ්‍රිත ප්‍රදේශ වර්ණනා කර ඇති අයුරු, ''සාරථී'' ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. වයි. කේ. තිස්ස බණ්ඩාර, මධ්‍යම පළාත් සංස්කෘතික අමාත්‍යාංශයේ වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය.

23. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** නිර්වාණය හා එහි ප්‍රභේද, නිර්වාණය ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. කොටියාගල උපරතන හිමි, කොටියාගල ශ්‍රී චන්දානන්ද නාහිමි ශාස්ත්‍රීය සංග්‍රහය.

24. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ චුල්ලවග්ගපාළියේ හා සමන්තපාසාදිකවේ අන්තර්ගතය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්, සාධනප්පසාද ශාස්ත්‍රීය සංග්‍රය, සංස්. මැදගම්පිටියේ විජිතධම්ම හිමි, මිරිස්වත්තේ විමලඤාණ හිමි, වරදිවෙල ශ්‍රී පූර්වාරාම විහාරීය එකසිය පණස්වෙනි සාංවත්සරික ශාස්ත්‍රීය සංග්‍රහය, 2011 නොවැම්බර්.

25. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** දඹදෙණි යුගයේ කාව්‍යයන්හි දක්නට ලැබෙන සුවිශේෂතා, ''අනුදීපනා'' ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. වැලිවිට සොරත හිමි, අතිපූජ්‍ය කුළුගම්මන ශ්‍රී ධම්මරක්ඛිත නාහිමි, ශාස්ත්‍රීය සංග්‍රහය, 2011 නොවැම්බර්.

26. **පූජ්‍ය වැලිවිට සෝරත හිමි,** ''අනුදීපනා'' අතිපූජ්‍ය කුළුගම්මන ශ්‍රී ධම්මරක්ඛිත නාහිමි ශාස්ත්‍රීය සංග්‍රහය 2011 නොවැම්බර් - මාගධී - පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන.

27. **පූජ්‍ය වලවාහැංගුනවැවේ මහින්දරතන හිමි,** "Laṅkayaṃ Seṅkhaṇḍaselapura Rājadhānisamaye Māgadhi Bhāsam Pāyogikaraṇatthāya Velivita Saraṇankara Saṅgharājatherena katakamopāyāni″ Journal of International Buddhist Studies (JIBS) vol IV, Mahachulaloungkornrājavidyalaya University, Thailand - 2011 – January

28. **පූජ්‍ය වලවාහැංගුනවැවේ මහින්දරතන හිමි,** මහින්‍දවංසො මහින්‍දරතන ව්‍යාඛ්‍යා, කතෘ ප්‍රකාශන, මුද්‍රණය ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

29. **පූජ්‍ය මැඩියාවේ පියරතන හිමි**, A research paper on "**An Analysis on the Character of Buddha Presented in Pali Canon"** in Memorial Journal "Anudipana", Essays in Honour of Venerable Kulugammana Sri Dhammarakkhita, 2011.

30. **පූජ්‍ය මැඩියාවේ පියරතන හිමි**, A research paper on "**Buddhist Approach to the Political Conflict and Peace"** in "One Buddha , One Sangha" magazine of the 8th General Conference of World Buddhist Sangha Youth conference**,** 2011

## සමාජයීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය

01. **පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම හිමි,** ***A New Research on Trilingual Stele*** (chi) in Journal of Southeast Culture/ dongnan wenhua/Nanjing: China. pp. 70-78

02. **පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම හිමි,** ***The ancient Chinese Coins found from archaeological excavation in Sri Lanka*** **(Eng) .** The International Association for Asian Heritage (IAAH). 2011. University of kelaniya. p.20

03. **පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම හිමි,** ***The Chinese Coins Found in Sri Lanka: A Preliminary Study*** (Eng). *Royal Asiatic Society Annual Conference. 2011. p. 20*

04. **පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම හිමි, ගාමිණී රණසිංහ මහතා,** ***A Study of Chinese coins In Sri Lanka***,Xiamen (Eng)University of China, Maritime Archeological Conference 2012

05. **පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම හිමි, රංජිත් බණ්ඩාර මහතා,** ***Village Abandonment Behavior Among Tank Villagers: the Effect of Carrying Capacity on a Tank-Village in the Dry Zone of Sri Lanka*** (En). Symposium, Society of South Asian Archaeology. pg no.26

06. **පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම හිමි,** ***Sri Lankan coinage, technology and myths*** (Chi). PhD student's Academic symposium' University of Shandong-China, pg no.36

07. **පූජ්‍ය ආචාර්ය අම්බලන්තොට චන්දිම හිමි,** (斯里兰卡藏中国古代文物研究)Ancient Economic System Between China and Sri Lanka based on Archaeological evidence. http://cdmd.cnki.com.cn/Article/CDMD-10422-1011170804.htm.(published on Chinese library service)

08. **පූජ්‍ය වැවල ධම්මාලෝක හිමි, මහාචාර්ය පියදාස රණසිංහ,** "ත්‍රිපිටකාගත ඥාන වර්ගීකරණය Empowering Young Librarians, Godage International Publishers, Colombo. 2011, 29 p.

09. **පූජ්‍ය වැවල ධම්මාලෝක හිමි,** සම්බුද්ධත්වයේ විශ්වසංකේතය : ධර්ම චක්‍රය, අත්‍රිදිපතා, සංස්.වැලිවිට සෝරත හිමි, මාගධි, පාලි බෞද්ධ අධ්‍යයන ආයතනය, පුවක්පිටිය. 2011, පිටු. 19

10. **පූජ්‍ය ආචාර්ය වරදිවෙල විජයසුමන හිමි,** වැලිවිට සඟරජ හිමියන්ගේ අධ්‍යාපනික සේවය පිළිබඳ විමර්ශනයක් - සාරථී ශාස්ත්‍රීය සංග්‍රහය, මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව. 2011

11. **පූජ්‍ය ආචාර්ය වරදිවෙල විජයසුමන හිමි,** කළමනාකරණය පිළිබඳ බෞද්ධ ආකල්පය. නාපාන ශ්‍රී ප්‍රේමසිරි නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය. 2011

12. **පූජ්‍ය ආචාර්ය වරදිවෙල විජයසුමන හිමි,** ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ අධ්‍යාපන දර්ශනය : දර්ශන අධ්‍යයනය ශාස්ත්‍රීය සංග්‍රහය - හෝමාගම ධම්මානන්ද නාහිමි, අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය. 2011

## ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය

01. **පූජ්‍ය ආණමඩුවේ ධම්මදස්සි හිමි,** මාතෘකාව ''විඥානය, අවිඥානය සහ අවින්දනාත්මක නිර්වාණ සැපත'', සඟරාව ''නිර්වාණය'' කොටියාගල චන්දානන්ද නාහිමි අභිස්තව ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්කාරක - ආචාර්ය කොටියාගල උපරතන හිමි, 2011 - ඔක්තෝම්බර්

02. **පූජ්‍ය කහටගස්දිගිලියේ ධම්මරතන හිමි,** රජරට බෞද්ධ සංස්කෘතියේ පැරණි සමාජය තුළින් පිළිබිඹු වන ආයුර්වේද සංකල්ප. ශාස්ත්‍රීය ලිපිය, විදග්ධ සඟරාව, සාහිත්‍ය කමිටුව, බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය, බු. ව. 2554 ඇසළ මස

03. **පූජ්‍ය බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි,** මාතෘකාව ''භාවනාව හා නිර්වාණය'' සඟරාව ''නිර්වාණය'' කොටියාගල චන්දානන්ද නාහිමි අභිස්තව ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්කාරක - ආචාර්ය කොටියාගල උපරතන හිමි. 2011 - ඔක්තෝම්බර්.

04. **පූජ්‍ය බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි,** මාතෘකාව ''සිවු දිසාවකින් ආරක්ෂාව සපයන චතුරාරක්ඛා භාවනාව'', සඟරාව - ''අනුදීපනා'' අතිපූජ්‍ය කුඑගම්මන ශ්‍රී ධම්මරක්ඛිතාභිධාන නායක ස්වාමීන්ද්‍ර අනුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්කාරක - වැලිවිට සෝරත හිමි, 2011 - නොවැම්බර්.

05. **පූජ්‍ය බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි,** මාතෘකාව - ''චරිත විභාගය හා පලිබෝධ පිළිබඳ හැදින්වීමක්'', සඟරාව - ශ්‍රී ආයුපාල නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්කාරකවරු - වැල්ලෑවේ ශ්‍රී නන්දානන්ද නාහිමි කනත්තෙගොඩ සද්ධාරතන හිමි, 2011 - වර්ෂය.

06. **බී. වෙනුර ලක්ෂ්මන් මහතා,** (2011) Optical Character Recognition of Sinhala fonts, Pravachana Megazine, Second Edition, Buddhasravaka Bhiksu University, Anuradhapura. Pages 191-197

07. **පූජ්‍ය කහටගස්දිගිලියේ ධම්මරතන හිමි,** සම්මන්ත්‍රණ පත්‍රිකා, පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම සඳහා උපයෝගී කර ගත හැකි සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් වල විද්‍යාත්මක අංශය විමසා බැලීම. 2011-10-24,25 හා 2011-11-09,11 යන දින වල.
(මෙහෙයවීම - මධ්‍යම සංස්කෘතික අරමුදල) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ 07

08. **පූජ්‍ය බළන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි,** සම්මන්ත්‍රණ පත්‍රිකා, ජාත්‍යන්තර පාලි සම්මන්ත්‍රණය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, මාතෘකාව - " The Value of Pali Commentaries as Source Meterial for the Study of Buddhism", 2011-09-01

## බෞද්ධ අධ්‍යයන අංශය

01. **පූජ්‍ය ආචාර්ය කනත්තේගොඩ සද්ධාරතන හිමි,** ග්‍රන්ථය '' බුදුහාමුදුරුවෝ මනෝ වෛද්‍යවරයෙකි.'' සරස්වතී මුද්‍රණාලය, දිවුලපිටිය

02. **පූජ්‍ය ආචාර්ය කනත්තේගොඩ සද්ධාරතන හිමි,** ග්‍රන්ථය '' කායික රෝග සහ බුදුසමය.'' සරස්වතී මුද්‍රණාලය, දිවුලපිටිය

03. **පූජ්‍ය ආචාර්ය කනත්තේගොඩ සද්ධාරතන හිමි,** ග්‍රන්ථය '' පරිසරය හා බුදුසමය'' සරස්වතී මුද්‍රණාලය, දිවුලපිටිය

04. **පූජ්‍ය මහාචාර්ය පාතේගම ඤාණිස්සර හිමි,** ග්‍රන්ථය '' යතිවරයෙකුගේ කටුසටහන් 02.'' ඇස් ගොඩගේ සහ සමාගම - කොළඹ

05. **පූජ්‍ය මහාචාර්ය පාතේගම ඤාණිස්සර හිමි,** ග්‍රන්ථය '' යතිවරයෙකුගේ කටුසටහන් 03.'' ඇස් ගොඩගේ සහ සමාගම - කොළඹ

06. **පූජ්‍ය මහාචාර්ය පාතේගම ඤාණිස්සර හිමි,** ග්‍රන්ථය ''නොපෙනෙන ලෝකය '' ඇස් ගොඩගේ සහ සමාගම - කොළඹ

07. **පූජ්‍ය අක්මීමණ ධම්මපාල හිමි,** ශාස්ත්‍රීය ලිපි, '' භවපච්චයා ජාති'', '' ජයසුමනාරාම ශාස්ත්‍රිය සංග්‍රහය''

08. **පූජ්‍ය අක්මීමණ ධම්මපාල හිමි,** ශාස්ත්‍රීය ලිපි, '' ශාරීරික සහ පාරිභෝගික චෛත්‍යවල ඇති ආගමික හා ඓතිහාසික පසුබිම පිළිබඳ ශාස්ත්‍රීය විමර්ශනයකි'', ''මරදගහමුල වාලුකාරාම පුරාණ විහාරස්ථ ශාස්ත්‍රිය සංග්‍රහය''

09. **පූජ්‍ය කිරිමැටියාවේ ධම්මසිරි හිමි,** '' ශ්‍රී ආයුපාල නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, 2011, මානව අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ දෘෂ්ටි කෝණයකින් විමසුමක්''

10. **පූජ්‍ය කිරිමැටියාවේ ධම්මසිරි හිමි,** ''කොටියාගල චන්ද්‍රානන්දාභිධාන නායක ස්වාමීන්ද්‍ර අභිස්තව ශාස්ත්‍රීය සංග්‍රහය, 2011, කර්මය හා නිර්වාණය''

11. **පූජ්‍ය කිරිමැටියාවේ ධම්මසිරි හිමි,** පරියත්ති (පස්වන කලාපය) ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ පරියත්ති සංවර්ධන සභාව, 2011, නමස්කාර පාඨයෙහි ආරම්භය හා විකාශනය''

12. **පූජ්‍ය කිරිමැටියාවේ ධම්මසිරි හිමි,** ''බිබිලාදෙණිය ශ්‍රී මලියදේව ශාස්ත්‍රීය සංග්‍රහය, 2011, පැන් පූජාවේ අනුසස් පිළිබඳ විමසුමක්''

13. **පූජ්‍ය කිරිමැටියාවේ ධම්මසිරි හිමි,** ''අනුදීපනා කුළුගම්මන ශ්‍රී ධම්මරක්ඛිතාභාධාන ශාස්ත්‍රිය සංග්‍රහය, 2011, An Inquiry into the concept of Bodhisattava''

14. **පූජ්‍ය කිරිමැටියාවේ ධම්මසිරි හිමි,** ''සාධනප්පසාද ශාස්ත්‍රිය සංග්‍රහය, 2011, Buddhist Attitude towards the Abortion ''

15. **පූජ්‍ය ආචාර්ය කඩවත්ගම පියරතන හිමි,** ශාස්ත්‍රීය ලිපි ''අසංස්කෘත නිර්වාණය'', ''මාගධි සඟරාව'', සංස්, ආචාර්ය කොටියාගල උපරතන හිමි, 2011

## ඇමුණුම් ii

**මානමුනාවත්ත නව පරිශ්‍රයේ ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව**

### 01. පරිපාලන ගොඩනැගිල්ල

| | |
|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම | - රු. මිලියන 103 |
| ආරම්භ කළ දිනය | - 2008.10.16 |
| ගොඩනැගිල්ල භාර දිය යුතු දිනය | - 2010.06.16 |

මෙම ගොඩනැගිල්ලලේ ඉදිකිරීම් 2011.02.28 දින අවසන් කර විශ්වවිද්‍යාලයට භාර දෙන ලදී. 2012.04.02 දින මෙම ගොඩනැගිල්ලේ රාජකාරි කටුයතු ආරම්භ කරන ලදී.

### 02. ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම

මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම අදියර 02 කින් සිදුකල අතර එක් එක් අදියරය වෙන වෙනම කොන්ත්‍රාත් කරුවන් දෙදෙනෙකුට පවරා ඉටුකර ගන්නා ලදී.

**පළමු අදියර**

| | |
|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම | - රු. මිලියන 6 |
| ආරම්භ කළ දිනය | - 2007.10.11 |
| ඉදිකිරීම් අවසන් කළ දිනය | - 2009.03.19 |

මෙම අදියරය ආර්.ජේ.පි. කන්ට්‍රක්ෂන්ස් ආයතනය පවරා ඉටුකර ගන්නා ලදී. සම්පූර්ණ වැය මිලියන 09 කි.

**දෙවන අදියර**

| | |
|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම | - රු. මිලියන 14 |
| ආරම්භ කළ දිනය | - 2009.11.23 |
| ඉදිකිරීම් අවසන් කළ දිනය | - 2010.06.02 |

මෙම අදියරය එඩ්වඩ් ඇන්ඩ් ක්‍රිස්ටි ආයතනය පවරා ඉටුකර ගන්නා ලදී. සම්පූර්ණ වැය මිලියන 16 කි.

මේවන විට පළමු වසර සිසුන්ගේ නේවාසික පහසුකම් වෙනුවෙන් මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගනු ලැබේ.

### 03. බෞද්ධ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම

| | |
|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම | - රු. මිලියන 268 |
| ආරම්භ කළ දිනය | - 2010.09.02 |
| ගොඩනැගිල්ල භාර දිය යුතු දිනය | - 2012.09.01 |

බෞද්ධ අධ්‍යයන පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම්වලින් 41% ක් පමණ මේ වන විට නිමකර ඇත. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අත්තිවාරම් කැපීමේදී ගල් තට්ටුවක් හමුවීම නිසා ඒවා වෙඩි දමා පුපුරවා හැරීමට සිදුවිය. තවද 2011 වර්ෂය ආරම්භයේදි පැවැති අධික වර්ෂා තත්ත්වය නිසා ගංවතුර ගැලීමක් සිදුවූ අතර එම ගංවතුර මට්ටම යෝජිත ගොඩනැගිල්ලේ බිම් මහලට වඩා වැඩි

විය. මේ නිසා ඉදිරියේදී මෙවැනි ගංවතුර තත්ත්වයන්ට ඔරොත්තු දෙන සේ සැලසුම් කළ ප්‍රමාණයට වඩා අත්තිවාරම උස්සා සකස් කිරීමට සිදුවිය. මෙම හේතු කාරණා නිසා ගොඩනැගිල්ලේ ඉදිකිරීම්වල ප්‍රමාදයක් සිදුව ඇත.

## 04. ට්‍රාන්ස්ෆොමර් කාමරය

නව පරිපාලන ගොඩනැගිල්ලේ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය විදුලිය ලබා ගැනීම මුලික කොට ගෙන ඉදිරියේදි විශ්වවිද්‍යාල පද්ධතියටම අවශ්‍ය විදුලිය ලබා ගැනීමට ට්‍රාන්ස්ෆෝමර් කාමරයක් ඉදිකරන ලදී. මෙම කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා ඉටුකර ගන්නා ලදී. සම්පූර්ණ වැය මිලියන 0.5 කි.

## 05. නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම

| | |
|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම | - රු. මිලියන 118 |
| ආරම්භ කළ දිනය | - 2012.02.07 |
| ගොඩනැගිල්ල භාර දිය යුතු දිනය | - 2012.11.14 |

නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම්වලින් 48% ක් පමණ මේ වන විට නිමකර ඇත. එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිමකර 2012.11.14 දිනට භාර දීමට නියමිතව තිබුණි. නමුත් නිම කළ වැඩ කොටස් සඳහා මුදල් ගෙවීමේ ප්‍රමාදයක් තිබුණු බැවින් 2013.01.31 දින දක්වා කාලය දිර්ඝ කිරීමක් ඉල්ලා ඇත. මෙම ඉල්ලීම පාලක සභාවේ අනුමැතියට මේ වනවිටත් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සියල්ලම මේ වනවිට මිලදී ගෙන ඇති බැවින් සැලසුම් කළ පරිදි 2013.01.31 දිනට මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටුයතු අවසන් කර භාර දීමට ඉංජිනේරු සංස්ථාවේ නිලධාරින් එකඟ වී ඇත.

## 06. ආරක්ෂක මුරකුටි 02ක් ඉදිකිරීම

| | |
|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම | - රු. මිලියන 3 |
| ආරම්භ කළ දිනය | - 2012.09.17 |
| ගොඩනැගිල්ල භාර දිය යුතු දිනය | - 2012.12.16 |

නව පරිශ්‍රයේ ආරක්ෂක මුරකුටි 02 ක් ඉදිකිරීමේ කාර්ය ආරම්භ කර ඇත. මේ වන විට එම මුරකුටි දෙකේ අත්තිවාරම් ඉදිකිරීමේ කටයුතු අවසන් කර බිත්ති බැදීමේ කාර්‍යයෙන් කොටසක් ද අවසන් කර ඇත. කෙසේවෙතත් මෙම ආරක්ෂක මුරකුටි නියමිත දිනට එනම් 2012.12.16 වන දිනට වැඩ නිමකර භාර දීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිලධාරින් එකඟ වී ඇත.

## වෙනත් කරුණු

පසුගිය මාසයක පමණ කාලය තුළ භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණත් ගරු මහෝපාධ්‍යායයන් වහන්සේගේ බලවත් ඉල්ලීම මත මෙම විශ්වවිද්‍යාලයට රු.මිලියන 60ක ප්‍රතිපාදන මේ වනවිට ලබා දී ඇත. මේ පිළිබඳව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ තැනීම් කළමණාකාරවරයා විසින් විශේෂ ස්තුතියක් ගරු මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත පුද කරන ලදි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No — එන්සී/ඒපී/ඊ/2012/22
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date — 2012 සැප්තැම්බර් 26 දින

මහෝපාධ්‍යායයන් වහන්සේ,
බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය.

බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 46 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත 2012 මැයි 18 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone — 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. — 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. — oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද, ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මත සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 උපස් ගිණුම්කරණ පරිවයයන්

සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත්, තවදුරටත් ප්‍රයෝජනයට ගෙන තිබුණු පිරිවැය රු.19,427,139 ක් වූ වත්කම් විෂයයන් 12 ක් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු.

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අයිතම 03 කට අදාළ වියදම් රු.77,229 කින් අඩුවෙන්ද, අයිතම 03 කට අදාළ වියදම් රු.147,224 කින් වැඩියෙන්ද, පොලී ආදායම රු.28,048 කින් අඩුවෙන්ද, විවිධ ආදායම් රු.38,621 කින් වැඩියෙන්ද, ණයහිමියන් රු.16,500 කින් අඩුවෙන්ද, කාර්යාල හා මෙවලම් උපකරණ විකිණීමේ ලාභය රු.33,451 කින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) නව විශ්වවිද්‍යාල භූමියේ ජල සැපයුම් පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදී තිබුණු රු.2,372,712 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ජල සැපයුම් පද්ධති යටතේ ප්‍රාග්ධනීත කර තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව බාහිර පාඨමාලා ආදායමෙන් මහෝපාධ්‍යායය අරමුදලට මාරුකල යුතු අගය රු. 298,025 වූ නමුත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන අනුව එය රු. 253,025 ක් වීමෙන් වූ රු.45,000 ක වෙනසට හේතූන් පැහැදිලි කර නොතිබුණි.

2.2.4 ලැබිය යුතු ගිණුම්

සේවකයින් 02 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.208,134 ක ණය ශේෂයන් 2011 මාර්තු සිට අයවීම හිඟ හිට තිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්.

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.188,153,520 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 08 ක් සමීක්ෂණ මණ්ඩල වාර්තා, විස්තරාත්මක උපලේඛන සහ පරිගණක ස්ථාවර වත්කම් ලේඛනය යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් තීරණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2006 අංක 16 දරන දේශිය ආදායම් පනතේ 153 වන වගන්තිය | අයභාර හෝ ප්‍රාග්ධන ස්වරූපයේ ඕනෑම භාණ්ඩයක් මිලට ගැනීම හෝ සේවාවක් ලබාගැනීම වෙනුවෙන් මසකට සිදුකරන ලද ගෙවීම රු. 50,000 ක් ඉක්මවන ගෙවීම් සඳහා 5% ක රඳවාගැනීමේ බදු අයකළ යුතු වුවද, ගෙවීම් අවස්ථා 02 කදී සැපයුම්කරුවකුට රු.4,840 ක රඳවාගැනීම් බදු මුදල් අඩු කර නොතිබුණි. |

(ආ) වකුලේඛ විධිවිධාන

---------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.4.3 (ඇ) වගන්තිය

ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම් නොකර වෙනත් සැපයුම්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවා නව පරිපාලන ගොඩනැගිල්ලට තිර රෙදි සපයා සවි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 450,878 ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 14,853,726 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 10,901,750 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම රු.3,951,976 ක් විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.14,853,726 ක ඌනතාවයක් වූ නමුත් පුනරාවර්තන වියදම් දැරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු.72,102,943 ක මුදලින්, විශ්වවිද්‍යාලයේ, මුදල් පිටතට ගලා යන වර්ෂයේ වියදම් දැරීමෙන් පසුව රු.2,350,808 ක අතිරික්තයක් විය. සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරින ලද ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය රු.17,346,850 ක්ද පාර්තෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.2,538,892 ක්ද, වශයෙන් විශ්වවිද්‍යාලයේ, මුදල් පිටතට ගලා නොයන වියදම් එකතුව රු.19,885,742 ක් සමාලෝචිත වර්ෂයේ ඌනතාවයට හේතු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මුදල් පිටතට ගලා නොයන වියදම් රු.7,868,393 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ ඌනතාවය වැඩි වීමට හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

4.1 කාර්ය සාධනය

------------------

(අ) එක් එක් වර්ෂය සඳහා බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයට බඳවා ගත්, අධ්‍යාපනය ලැබූ, උපාධි සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව සහ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයන් අතරින් උපාධිය සම්පූර්ණ කල ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය පහත දැක්වේ.

| වර්ෂය | එක් එක් වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | එක් එක් වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | එක් එක් වර්ෂයේ උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව | | | උපාධිය ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව එක් එක් වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|---|---|
| | | | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | ශාස්ත්‍රවේදී (විශේෂ) | එකතුව | |
| 2005 | 56 | 164 | 43 | 12 | 55 | 98 |
| 2006 | 44 | 148 | 14 | 17 | 31 | 70 |
| 2007 | 103 | 206 | 32 | 18 | 50 | 49 |
| 2008 | 98 | 243 | 78 | - | 78 | 80 |
| 2009 | 63 | 264 | අවසාන විභාගයට පෙනී සිට නැත | | | |
| 2010 | 53 | 222 | | | | |
| 2011 | 93 | 200 | | | | |

(ආ) සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලය මගින් සැලසුම් කළ දේශන පැය සංඛ්‍යාව 9420 ක් වූ අතර, පැවැත් වූ දේශන පැය සංඛ්‍යාව 7698 ක් වුයෙන්, සැලසුම්ගත පැය සංඛ්‍යාවෙන් 18% ක් වූ දේශන පැය 1722 ක් පවත්වා නොතිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂයේදී පරිගණක මෘදුකාංග Quick book 2011-pro-Accounting software මිලදී ගැනීම වෙනුවෙන් ගෙවා තිබුණු රු.6,250 ක් වූ ගෙවීම් පරිගණක මෘදුකාංග මිල දී ගැනීම් ලෙස ප්‍රාග්ධනිත කිරීම වෙනුවට පරිගණක මිලදී ගැනීම් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

## 4.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

රු. 75,756 ක් වූ ලිපි ද්‍රව්‍ය තොගයක් වර්ෂයකට අධික කාලයක සිට භාවිතයට නොගෙන ගබඩාවේ නිශ්ක්‍රියව පැවතුණි.

## 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ගිවිසුම්ගත මුදල රු.68,062,631 ක් වූ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ උපදේශක සේවා සැපයීම වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු. 4,083,758 ක් ගෙවා තිබුණු නමුත් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතාවය මත ගිවිසුම් ගත මුදලින් 24% ක ප්‍රමාණයක් වන රු.16,331,707 ක් අතිරේක වැඩ සඳහා වැඩිපුර දරා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.5 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

පහත නිරීක්ෂණයන් විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහාචාර්ය තනතුරු 03 ක් කථිකාචාර්ය තනතුරු 04 ක් සහ පුස්තකාලයාධිකාරි තනතුරු 01 ක් වශයෙන් තනතුරු 08 ක් පුරප්පාඩු පැවතුණි.

(ආ) විධායක කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලේකම් හා සහකාර ලේඛාධිකාරි වශයෙන් තනතුරු 02 ක්ද, විධායක නොවන කාර්ය මණ්ඩලයේ ආරක්ෂක පරීක්ෂක තනතුරු 02 ක් සහ බෞද්ධ උපදේශක තනතුරක්ද, සුළු සේවක රියදුරු තනතුරක්ද, කෝකි තනතුරු 02 ක්ද, පුරප්පාඩු පැවතුණි.

4.6 වාහන උපයෝජනය

----------------------

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල විසින් වාහන 10 ක් උපයෝජනය කර තිබුණු අතර, එකී වාහන සඳහා ඉන්ධන වියදම්, නඩත්තු හා අනෙකුත් රියදුරු වියදම් පැවති හා අතිකාල ක්ෂය ප්‍රතිපාදනය සඳහා රු.5,907,118 ක් වූ මුදල වියදමට අනුපාතිකව කිලෝමීටර් 85,704 ක් ධාවනය කර තිබුණි. ඒ අනුව කිලෝමීටර් එකක සාමාන්‍ය වියදම රු.68.92 ක් බව නිරීක්ෂණය විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම.

----------------------------------

2010 වර්ෂය වෙනුවෙන් වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනය

------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සමඟ ඇස්තමේන්තුගත ශේෂපත්‍රය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණු අතර, පුනරාවර්තන වැය විෂයයන් අටක් සඳහා සහ ගොඩනැගිලි ඉදිකිරීම් මූලධන වැය විෂය සඳහා පාලක සභාව අනුමත කර තිබුණු අයවැය ගත අගයන් සහ තථ්‍ය අගයන් අතර, 30% සිට 100% දක්වා ප්‍රමාණයක විචලනයක් දක්නට ලැබුණු අතර එයින් අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
පුත්තලම් පාර, අනුරාධපුර, ශ්‍රී ලංකාව

## BHIKSU UNIVERSITY OF SRI LANKA
PUTTALAM ROAD, ANURADHAPURA, SRI LANKA

මහෝපාධ්‍යාය / Mahopadyaya : 025-3257980 : 025-2222640
ලේඛකාධිකාරී / Registrar : 025-2222615
මූල්‍යාධිකාරී / Bursar :025-2223475
කාර්යාලය / Office : 025-2236760 : 025-2236340 : 025-2235328
ෆැක්ස්/Fax : 025-2222640
ෆැක්ස්/Fax : 025-2222615


මගේ අංකය My Ref. } භිවිවි/ආ/43/3(vi)    ඔබේ අංකය Your Ref. }    දිනය Date } 2012.11.16

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**<u>බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් මහ 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

උක්ත මැයෙන් අප වෙත එවන ලද ඔබගේ ලිපි අංක Nc/AP/E/2012/22 හා 2012 සැප්තැම්බර් මස 26 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව, එම වාර්තාවේ විමසුම් වලට අදාළ පිළිතුරු පහත දක්වා ඇත.

**2.2.1**
වටිනාකම සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති භාණ්ඩ ලේඛන පිළියෙල කර ඒවායේ මිළ නැවත නියම කිරීම සඳහා එම ලේඛන අනුරාධපුර තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇත.එම කාර්යාලයෙන් ඒවායේ මිළ නියම කර එවූ විගස එම වටිනාකම ගිණුම් වලට ගනු ලැබේ.

**2.2.2 (අ)**
අයිතම 03 ට අදාළ වියදම් වලින් රු. 50,625.00 ක ප්‍රමාණය 2010,2011 වසර සඳහා හිලව් වී ඇති හෙයින් 2012 වසර සඳහා එමගින් බලපෑමක් නැත. රු. 19,548. ක ප්‍රමාණය 2011 වසර තුළදී හිලව් වී ඇති හෙයින් 2012 වසර තුළ ඉදිරියට ගෙන ආ ශේෂයට බලපෑමක් වී නැත. ඉතිරිය සඳහා ජර්නල් සටහන් 2012/67 මගින් නිවරැදි කර ඇත. අයිතම 03 ට අදාළ රු. 93,920.00 ක ප්‍රමාණය බාහිර පාඨමාලාවල වියදම් ගිණුම් වර්ෂය එකක් නොවන නිසා ඉදිරියට ගෙන ආ ශේෂය හා ලැබෙන ආදායම් වලින් වියදම් පියවා ගැනීම සිදුවේ. ඒ අනුව, මෙම රු. 93,920.00 වැඩිපුර ගෙවීමක් සිදු කර නොමැත. රු. 15,598.00 ක මුදල 2010,2011 වර්ෂවල හිලව් වී ඇති බැවින් 2012/01/01 ඉදිරියට ගෙන ආ ශේෂයට බලපෑමක් සිදු වී නැත. පොලී ආදායම ගණනය කර ඇත්තේ 2011/12/31 දිනට මහජන බැංකුවේ ශේෂ සනාතන ලිපිය පරිදිය. රු. 38,621.00 වන විවිධ ආදායම් වැඩියෙන් දැක්වීම තුලින් 2012/01/01 දින ඉදිරියට ගෙන ආ ඌනතාවයට බලපෑමක් සිදු වී නොමැත. රු. 16,500.00 ක මුදල 2012 වසර තුළ 2012/69 ජර්නල් සටහන් තුළින් නිවැරැදි කිරීමට පියවර ගෙන ඇත. වත්කම් විකිනීමේ ලාභය රු. 33,451.00 ක මුදල 2012/70 ජර්නල් සටහනට අනුව නිවැරැදි කිරීමට පියවර ගෙන ඇත.

**2.2.2**

**(ආ)** 2012/72 ජර්නල් සටහන පරිදි දැනටමත් නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.

**2.2.3**

උපලේඛනය නිවැරදි කිරමට පියවර ගෙන ඇත.

**2.2.4**

එච්.එම්.පී.බී. හේරත් මහතා හා බී.එම්.එන්.ජී. සිරිවර්ධන මහතා 2011 මාර්තු මස සිට විශ්වවිද්‍යාල සේවයේ නොමැත. එම සේවක මහතුන් දෙදෙනාගේ සේවක අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී මෙම ණය ශේෂයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.2.5**

වත්කම් ලේඛනය පිළියෙල කර ඇත.

**2.2.6 (අ)**

ඉදිරියේදී කරන ගෙවීම් තුළින් රු. 4,840.00 ක මුදල අයකිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.6 (ආ)**

විශ්වවිද්‍යාලයේ සැපයුම්කරුවන්ගේ ලේඛනයේ ලියාපදිංචි තිරරෙදි සැපයුම්කරුවන් නොසිටි බැවින්, අනුරාධපුර තිරරෙදි සැපයීම සම්බන්ධ ප්‍රසිද්ධ ආයතනය මඟින් මිළගණන් කැඳවා තිරරෙදි සපයා ගන්නා ලදී.

**3.**

**3.1**

පිළිගනිමු.

**3.2**

පිළිගනිමු.

**4.**

**4.1 (අ)**

මෙම විශ්වවිද්‍යාලයේ 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ශිෂ්‍ය බඳවා ගැනීම් විස්තර පහත දැක්වේ.

| වර්ෂය | එක් එක් වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | එක් එක් වර්ෂයේ දී අධ්‍යාපනය ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 2005 | 56 | 164 |
| 2006 | 44 | 148 |
| 2007 | 103 | 206 |
| 2008 | 98 | 243 |
| 2009 | 63 | 264 |
| 2010 | 53 | 222 |
| 2011 | 93 | 200 |

ඉහත සංඛ්‍යා සටහන නිවැරදි බව පෙන්වා දෙමි.

**(ආ)**
අධ්‍යනාංශ 04 මගින් 2011 වර්ෂය සඳහා සැළසුම් කළ දේශන පැය ගණන 9420 කි.

සැළසුම්ගත දේශන පැය සංඛ්‍යාවෙන් 82% ක් දේශන පවත්වා ඇත. කළමනාකරණයේදී සැළසුම් යනු මනෝභාවමය පූර්ව නිශ්චායන අරමුණ වේ. එබැවින් සැළසුම් වලින් 100% ක් අපේක්ෂිත ඉලක්ක වෙත යොමු විය නොහැක.

2011 වර්ෂයේ දී පැවැත්වීමට නොහැකි වූ දේශන ගණන 1722 කි. එය සැලසුමට අනුව, 18% ක ප්‍රතිශතයකි.

ඊට හේතුව වන්නේ 2011.03.22 වන දින සිට 2011.07.04 දින දක්වා ශිෂ්‍ය හිමිවරුන්ගේ නවකවධ සිද්ධි හේතුවෙන් විශ්වවිද්‍යාලය මාස 03 කට අධික කාලයක් වසා තිබීමයි. ඒ අනුව, එම කාලය තුළ දේශන සැලසුමට අනුව පැවැත්වීමට නොහැකි විය.

**4.2**
ජර්නල් සටහන් 2012/71 මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

**4.3**
පිළිගනිමි. 2012 වසර තුළ අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

**4.4**
මෙම විශ්වවිද්‍යාලයේ මානමුනාවත්ත නව පරිශ්‍රයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ අතිරේඛ වැඩ සඳහා ගිවිසුම්ගත මුදලින් 21% ක ප්‍රමාණයක් වැය වී ඇත. ගොඩනැගිල්ල ඉදිකරගෙන යාමේ දී මුහුණ පෑමට සිදු වූ විවිධ ප්‍රායෝගික ගැටළු නිසා මෙම තත්ත්වය උදා විය. කෙසේ වෙතත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් වලට අනුව අතිරේක වැඩ සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු අදාළ ඉදිකිරීම් ආයතනය වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා සම්බන්ධ වී මේ වන විටත් සිදුකර ඇති බව කාරුණිකව දැනුම් දෙමි.

**4.5 (අ)**
අධ්‍යයන කාර්ය මණ්ඩලය
මහාචාර්ය තනතුරු 03 ක් හා කථිකාචාර්ය තනතුරු 04 ක් සඳහා ඉදිරියේ දී බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

පුස්තකාලයාධිකාරී තනතුර බඳවා ගැනීම සඳහා 2012.01.06 දින පුවත්පත් දැන්වීමක් මගින් අයද ම්පත් කැඳවන ලදී. ඉදිරිපත් කරන අයදුම්පත් අතර සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවකු සිටියද ඔහු තනතුර භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත.

**(ආ)**
අනධ්‍යයන කාර්ය මණ්ඩලය

**විධායක කාර්ය මණ්ඩලය**

පෞද්ගලික ලේකම් තනතුර
අයදුම්පත් කැඳවා ඇති අතර බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

සහකාර ලේඛකාධිකාරි තනතුරු
අයදුම්පත් කඳවා ඇති අතර බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**විධායක නොවන**

ආරක්ෂක පරික්ෂක තනතුරු 02

අයදුම්පත් කැඳවා ඇති අතර බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

බෞද්ධ උපදේශක තනතුරු 01

බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**සුළු සේවක**

රියදුරු තනතුරු 01

2012.04.02 වන දින මෙම තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කර ඇත.

කෝකි තනතුරු 02

පුරප්පාඩුව පවතින කෝකි තනතුරු 02 සම්පූර්ණ කිරීමට අමාත්‍යාංශයෙන් නාම ලේඛනයක් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉදිරියේ දී බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**4.6**

2011 වර්ෂය වන විට විශ්වවිද්‍යාලයේ ස්ථිර රියදුරු තනතුරු පුරප්පාඩු 03 ක් පැවති අතර, විශ්වවිද්‍යාලයේ සියළු ප්‍රවාහන කටයුතු සඳහා යොදවනු ලැබුයේ රියදුරන් 03 දෙනෙකි. (අනියම් රියදුරු තනතුරු 01 ඇතුළත්ව) මේ අනුව මෙම රියදුරන් තිදෙනාට අමතර අතිකාල දීමනා හා රියදුරු බටා ගෙවීමට සිදුවිය.

**5.**

**5.1**

නිවැරදියි.

**5.2**

2012.05.22 වන දින අභ්‍යන්තර විගණක, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යවා ඇත.

**6.**

පිළිගනිමු.

මෙයට ශාසනාලයැති,

පූජ්‍ය මහාචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්වාමින් වහන්සේ,
මහෝපාධ්‍යායයන් වහන්සේ.